# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ✻ 2018 නොවැම්බර් ✻ මෙත් සවිය පහළොස් වන කාණ්ඩය ✻ තිස්තුන් වන කලාපය

METHSAVIYA NEWSLETTER



නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: කඃ 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම
නිමිතිකොට
2012/01/08 වන
දුරුතු පොහෝ දින
ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීම
මෙත් සවිය විසින් අරඹන ලදී.

ඇස්තමේන්තු ගත මුදල
**රුපියල් ලක්ෂ 550 ක්**
පමණ වේ.







## 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීමේ

**දැක්ම :** බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදු වූ ඓතිහාසික මහියංගන රාජමහා විහාර භූමියෙහි අසූහාර දහසක් ධර්මස්කන්ධයන් සිහිවන සේ අඩි 84ක උසින් යුක්ත ව අහසින් වඩින ආකාරයට, අඩි 84ක් උසැති ලක්දිව උස ම හිටි පිළිමවහන්සේ වන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමාවහන්සේ ඉදිකිරීම.

**අරමුණ :** අප තථාගත ගෞතම බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයෙන් නම මසක් ඇවෑමෙන් වූ දුරුතු පුර පසළොස්වක පොහෝ දින ශ්‍රී ලංකාද්වීපයේ මහියංගනයේ මහවැලි නදිය අසබඩ මහානාගවන නම් වූ උද්‍යානයෙහි පැවැත්වෙන මහායක්ෂ සංගමය දිවැසින් දැක පළමුවර ශ්‍රී ලංකාවට වැඩම කොට, ඉහළ අහසේ පෙනී සිට, නොයෙකුත් ප්‍රාතිහාර්ය දක්වා යක් පිරිස් දමනය කර, ඔවුන් ගිරි දිවයිනට යවා, මෙම දිවයින ධර්මයෙහි පැවැත්වීමට සුදුසු ස්ථානයක් බවට පත්කළ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද පද්ම ස්පර්ශයෙන් පවිත්‍ර වන ලද්දා වූ ද, බුදුරජාණන් වහන්සේ ජීවමාන ලෙස වැඩසිටි කාලයේ දී ම තනන ලද්දා වූ ප්‍රථම චෛත්‍ය රාජයාණන් වහන්සේ ලෙස මහාවංශය ඇතුළු මූලාශ්‍රයන් හි සඳහන් වන ඓතිහාසික මහියංගන රාජමහා විහාරයට අයත් පුදබිමෙහි මෙතෙක් බුදුපිළිමයක් ගොඩනගා නැතිබැවින් එම අඩුව සපුරා බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සමරණු පිණිස ද, ඒ වෙනුවෙන්, බුද්ධශාසනය අවසානය වන තෙක් පවතින රට ලෙස සැලකෙන ශ්‍රී ලංකාද්වීපයෙහි චිරාත්කාලයක් පවත්නා පූජා වස්තුවක් ලෙස අසූහාරදහසක් ධර්මස්කන්ධයන් සිහිවන සේ අඩි 84ක උසින් යුක්ත ව අහසින් වඩින ආකාරයට අධාරකයක් නොමැති ලක් දිව උස ම හිටි පිළිමය වන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ගොඩනගා බුදුන් වැඩි ස්ථානයෙහි බුද්ධාලම්බන ප්‍රීතිය වැඩිවන අයුරින් බැතිමතුන් හට වන්දනා මාන කර කුසල් රැස්කරගැනීමට අවස්ථාව සැලසීම සහ බුද්ධ ශාසනයෙහි චිරස්ථිතිය පිණිස උපයෝගී වීම.

## මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න

☎ 0714 0144 67, 0112 50 50 88 ✉ office@methsaviya.org

බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීම සඳහා වන සියළුම ආධාර **"සම්පත් බැංකුවේ ( 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා අරමුදල )** නමින් ඇති **"000560001118"** ගිණුමට බැර කරන්න.

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.
දුඃකඃ 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❊ 2018 නොවැම්බර් ❊ මෙත් සවිය පහළොස් වන කාණ්ඩය ❊ තිස් තුන් වන කලාපය


## මෙත් සවිය 2017 / 2018 වසර සඳහා විධායක කමිටුව

**ගරු පැවිදි අනුශාසක**

රත්මලානේ මල්ලිකාරාමාධිපති, ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකවේදී
පූජ්‍යපාද රණස්ගල්ලේ ඥාණවීර ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති, දේශමාන්‍ය, විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී
මහාචාර්ය චන්දන ජයරත්න මහතා.
දු.ක : 0714800800 ෆැක්ස් : 0115678000
විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපති**

වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා. දු.ක : 077 628 0443
චින්තක බණ්ඩාර මහතා. දු.ක : 071 811 4477

**ගරු සම ලේකම්වරු**

කෝසල එදිරිසිංහ මහතා. දු.ක : 071 632 2306
මංජුල පත්මකුමාර මහතා. දු.ක : 071 529 5855

**ගරු භාණ්ඩාගාරික**

චමින්ද ඉන්දික මහතා. දු.ක : 071 229 9212

**ගරු උප භාණ්ඩාගාරික**

සුරංග ලියනගේ මහතා. දු.ක : 077 599 4987

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා. දු.ක : 071 228 5680

**ගරු කාරක සභිකවරු**

මෙනුර ධයස් මහතා / ජගත් ප්‍රසන්න මහතා
දර්ශන ගලප්පත්ති මහතා / මාලන් කන්දගේ මහතා
මහේන්ද්‍ර ජයනාත් මහතා / වේනුක ජයනාත් මහතා

**වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති**

දක්ෂිණ උදයංග මහතා

**බුදු පිළිම කමිටුව - සභාපති**

පී. ප්‍රේමදාස පෙරේරා මහතා

**කාන්තා කමිටුව - සභාපතිනිය**

රංජනී උඩුගොඩ මහත්මිය

**තරුණ කමිටුව - සභාපති**

පූර්ණ ප්‍රදීප් මහතා

**අසරණ සරණ කමිටුව - සභාපතිනිය**

එන්. එම්. දහනායක මහත්මිය

**සුව සෙත කමිටුව - සභාපති**

අතුල නානායක්කාර මහතා

**දාන - ශිල - භාවනා කමිටුව - සභාපති**

පියල් චන්ද්‍රතුංග මහතා

**අධීක්ෂණ කමිටුව**

ජී. ජී. තිලකසිරි මහතා
වික්‍රම ගුණදාස මහතා

**අප ගැන වචනයක්**

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර පහළොවකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි**. වර්තමාන සාමාජික සංඛ්‍යාව 6,000 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටුව හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය ලෙස පවත්වා ගනිමින් **"මෙත් සවිය මෛත්‍රී සංසදය"** පසුගිය පහළොස් වසර පුරා සමථ විපස්සනා භාවනාව හය දහසකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතින් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රාජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහිවන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති **"2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර පහළොව පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## බුදුපිළිමයේ තැන්පත් කිරීම සඳහා ත්‍රිපිටකය රන් ආලේපිත තඹ පත්තිරු වල ග්‍රන්ථාරූඪ කිරීමේ පුණ්‍යෝත්සවය

2018 දෙසැම්බර් 16 වන දින මහියංගනය රාජමහා විහාර පුදබිමෙහි බුදුපිළිමයේ තැන්පත් කිරීම සඳහා ත්‍රිපිටකය රන් ආලේපිත තඹ පත්තිරු වල ග්‍රන්ථාරූඪ කිරීමේ පුණ්‍යෝත්සවය වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී පෙරවරු 9.00 ට ආරම්භ කිරීමට නියමිතය.

## 2019 වසර සඳහා නොමිලයේ බෙදා හරිනු ලබන මෙත්සවිය දින දර්ශනය

2019 වසර මෙත් සවිය දින දර්ශනය 2018 දෙසැම්බර් 16 වන ඉරුදින සිට මෙත් සවිය කාර්යාලයෙන් ලබාගත හැකිය.

## 2019 ජනවාරි 01 දින ගංගාරාමයේ හීල් දානය

2019 / 01 / 01 දින කොළඹ හුණුපිටියේ, ගංගාරාම විහාරස්ථානයේ දී වර්ෂය ආරම්භ කිරීම නිමිතිකොට ගෙන පවත්වනු ලබන සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවට සහභාගී වන 20 - 30 නමක් පමණ සංඝයා වහන්සේලා උදෙසා අළුයම පවත්වනු ලබන හීල් දානමය පුණ්‍යකර්මය සඳහා සහභාගී වීමට කැමති මෙත්සවිය සාමාජිකයින් එදින පෙ.ව. 6.15 ට ගංගාරාම විහාරස්ථානය වෙත පැමිණිය යුතුය. පෙ.ව. 8.00 ට පෙර දානයේ වැඩ කටයුතු අවසන් වේ. මේ සඳහා අවශ්‍ය කිරිබත්, ඉදිආප්ප, සීනි සම්බල්, පලතුරු, පිරිකර ආදී දානමය ද්‍රව්‍යයන් භාරගැනීමට කැමති පින්වතුන් ඇත්නම්, කාර්යාලය (071 401 44 67) හෝ දාන-සීල-භාවනා කමිටු සභාපති පියල් චන්ද්‍රතුංග මහතා (071 450 1358) හෝ දාන සංවිධායක වික්‍රම ගුණදාස මහතා (071 221 0620) අමතා තොරතුරු ලබා ගන්න.

## 2019 ජනවාරි 01 දින ජයන්ති ළමා නිවාසයට දහවල් දානය

බෞද්ධාලෝක මාවතේ සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය අසලින් වමින් ඇති කුඩා පාරෙන් ගිය විට "**ජයන්ති ළමා නිවාසය**" හමු වේ. වසර 5 ට අඩු ළමුන් 20 - 30 පමණ ඇත. ළමයින් සඳහා දහවල් දානය සහ අත්‍යවශ්‍යය භාණ්ඩ පරිත්‍යාග කිරීම මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. (හාල්, පරිප්පු, සීනි ආදී වියළි ආහාර, රසකැවිලි, ක්‍රීඩා භාණ්ඩ) ආදී ද්‍රව්‍ය මෙත් සවිය කාර්යයාලයට ලබා දියහැක.

## 2019 ජනවාරි 06 පළමු ඉරු දින වැඩසටහන ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේ දී නොපැවැත්වේ

ජනවාරි 01 වන දින පවත්වන වැඩසටහන නිසා මෙදින වැඩසටහන නොපැවැත්වේ.

## 2019 පෙබරවාරි 03 වන දින මීළඟ දාන - සීල - භාවනා වැඩසටහන

2019 / 02 / 03 වන ඉරු දින පූජ්‍ය මඩවල උපාලි හිමි වැඩ වසන බණ්ඩාරවෙල කිතල් ඇල්ල රත්මල් කන්ද භාවනා මධ්‍යස්ථානයෙහි පැවැත්වේ. ඉන්පසු මහියංගනය රාජමහා විහාරස්ථානයේ බුදු පිළිමය තැනීම අධීක්ෂණය කිරීමට සහ සොරබොර වැව නැරඹීම සඳහා සැලසුම්කර ඇත. 2019 පෙබරවාරි 02 වන සෙනසුරාදා රාත්‍රී 10.00 ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් සුඛෝපබෝගී බස්රථ මගින් පිටත් වේ. පසුදින (ඉරුදින) රාත්‍රී 9.00 ට ප්‍රථම නැවත කොළඹට පැමිණීමට බලාපොරොත්තු වේ.පෙබරවාරි 04 නිවාඩු දිනයක් බැවින් ගමන වඩාත් පහසු වේ. පවුලේ සාමාජිකයන්හට ද සහභාගී විය හැක. බරපැන රු. 2500/- ක් පමණ වේ.

## 2019 මාර්තු 03 වන දින සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වන වැඩමුළුව

සාමජිකයින් සඳහා සහ ඔවුන්ගේ දරුවන් සඳහා නොමිලයේ පැවැත්වෙන මෙම ඉතා වැදගත් වැඩසටහන ප.ව 1 සිට ප.ව 5 දක්වා කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨ පරිශ්‍රයේ පිහිටි ක්‍රීඩා පිටිය අසල නව කලාගාරයේ දී පැවැත්වේ (ඇතුළුවීම රීඩ් මාවත සහ තර්ස්ටන් මාවත). මිනිසා විසින් උපතේ සිට මරණය දක්වා නොකඩවා සිදුකරන ක්‍රියාවලියක් වන ඉගෙනීම නිසි පරිදි සිදු කරන අයුරු පැහැදිලි කරන මේ වැඩමුළුව ළමා හා වැඩිහිටි සියලු දෙනාටම වැදගත්ය. මෙත්සවිය සංසදයේ සාමාජිකයින් හා ඔවුන්ගේ දරුවන් සඳහා නොමිලයේ පවත්වන සාර්ථකව ඉගෙනීම හා විභාග සමත් වීමේ නවීන ක්‍රමවේද පිළිබඳ වැඩමුළුවට ඔබට හා ඔබේ දරුවාට ද සහභාගී විය හැක. සාමාජික හවනා සමග නොපැමිණ ළමුන් තනිව පැමිණෙන්නේ නම් උප්පැන්න සහතිකයේ පිටපතක් හා සාමාජිකයාගේ ලිපියක් රැගෙන ආ විට නොමිළයේ සහභාගී විය හැකිය. එක් සාමාජිකයෙක් සඳහා එක් මුද්‍රිත සටහනක් පමණක් සැපයේ. සාමාජික නොවන බාහිර සිසු සිසුවියන්ට හා අන් අයටද සහභාගී විය හැකි අතර මුද්‍රිත ද්‍රව්‍ය හා ශාලා ගාස්තු සඳහා යන බරපැන පියවීම සඳහා එවැනි අයෙකු විසින් රු. 500/- ක මුදලක් එදිනට ආයෝජනය කල යුතු වේ. මේ සඳහා 2019 / 02 / 25 දිනට පෙර 0714 0144 67 හෝ 0112 50 50 88 අමතා ලියාපදිංචි වන්න. වයස 12 ට වැඩි ඕනෑම අයෙකුට සහභාගී වීය හැකිය. පාඩම් කිරීමේ නවීන ක්‍රම, වේගයෙන් ලිවීමේ, කියවීමේ ක්‍රමවේද, ඉගෙනීමට බාධාවන මානසික රෝග හඳුනාගැනීම, මතකය වර්ධනය සඳහා ක්‍රියාමාර්ග, බුද්ධි වර්ධන අභ්‍යාස, කාලසටහන් තැනීම, ස්වයං යෝජනා ක්‍රම හා විභාගයකදී සමත් වීමට පිළිතුරු ලියන පිළිවෙල ආදී වැදගත් කරුණු රාශියක් මෙහි දී ප්‍රායෝගිකව හඳුන්වා දේ. සාමාජික කණ්ඩායම් අංක 1 සිට 37 කණ්ඩායම් දක්වා මීට ඉහත දී මෙම වැඩසටහනට සහභාගී වී ඇති සාමාජිකයින් ඔවුන් වෙත ඇති මුද්‍රණ සටහන් රැගෙන ඒමට කාරුණික වන මෙන් ඉල්ලා සිටිමු.

## මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

## අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

## මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එල කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එල කරනු ලබන දැන්වීම් 2019 / 02 / 28 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

## මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

## 2019/04/07 මෙත් සවිය, වාර්ෂික මහ සභා රැස්වීම /ධර්ම දේශනාව සහ මෛත්‍රීභූෂණ සම්මාන උලෙළ.

මෙත් සවිය 16 වන මහා සමුළුව 2019/04/07 වන දින පැවැත්වේ. 2018 අයවැය ඉදිරිපත් කිරීම හා නව නිලධාරි මණ්ඩලය පත්කර ගැනීම කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂී බෞද්ධ ආශ්‍රමයේදී, ධර්ම දේශනාව අවසානයේ දී පැවැත්වේ. ස්ථානය වෙනස් වේ නම් වෙබ් අඩවිය හරහා මෙන්ම බුදුසරණ පුවත්පත මගින් දැනුම් දෙන්නෙමු. එදින සාකච්ඡාව සඳහා නව යෝජනා ඇති නම් 2019 / 03 / 07 දිනට පෙර කාර්යාලයට භාර දෙන්න. මෙතෙක් සාමාජිකත්වය අලුත් නොකර ඇති සියලුම දෙනා වාර්ෂික මහා සභා රැස්වීමට පළමුව සාමාජිකත්වය අලුත් කරගන්නා මෙන් ඉල්ලමු. එදින අනුපමේය සේවයක් කර ඇති පුද්ගලයින්ට මෙත් සවිය ගෞරව උපහාර සම්මාන පිරිනැමීමට බලාපොරොත්තු වේ.

මෙහි හතරවන කොටස පසුගිය කලාපයේ පළ විය...

# කෙලෙස් 1500

## 5 වන කොටස...

### 8. ගරුකාරමදෝ

''අන්‍යයන්ට කිසිවකු විසින් ගෞරවයෙන් සැකිල්ලක් දක්වන්නේ නැත. මා හට වනාහි දුටු දුටු සෑම දෙනා ම ගරු කරති. සලකති''යි මහජනයාගෙන් ගෞරව ලබන ඇතැම් ගිහියන්ට ඇතිවන අන්‍යයන් පහත් කොට තමන් උසස් කොට ගන්නා වූ අධික මානය ගරුකාර මද නම් වේ. එයින් මත් වූයේ නිතරම සෑම තැනකදී ම අන්‍යයන්ගෙන් ගරු සැලකිලි බලාපොරොත්තු වේ. නො ලැබෙන තැන දී දොම්නසට පත් වේ. ගරු නො කරන්නාවුන්ට විරුද්ධ වේ. එයින් ඔහු ජනයාට අප්‍රිය බොහෝ දෙනා හෙළා දකින පුද්ගලයෙක් වේ. මෙබඳු පුද්ගලයන්ට කෛරාටිකයෝ බොරුවට ගෞරව දක්වා ප්‍රයෝජන ලබති.

### 9. පුරෙක්ඛාරමදෝ

කථාවෙහි දක්‍ෂ උගත් ධනවත් ක්‍රියාශූරත්වය ඇති පුද්ගලයන් පෙරටු කොට ගෙන ඔවුනට මුල් තැන දෙමින් මහජනයා වැඩ කරති. ජනයා විසින් මුල් තැන දෙන්නා වූ පෙරටු කර ගන්නා වූ අයට ඒ නිසා තමන් උසස් ය. සෙස්සන් පහත් ය කියා මත්වීම් ආකාරයෙන් ඇති වන අධිකමානය පුරෙක්ඛාර මද නම් වේ. එයින් මත් වූයේ ගිය ගිය තැන ප්‍රධානත්වය බලාපොරොත්තු වේ. ප්‍රධානත්වය නො ලද හොත් දොම්නසට පත් වේ. ප්‍රධානත්වය සඳහා සටන් කරයි. ප්‍රධානත්වය නොලද තැන කටයුතු අවුල් කරන්නට උත්සාහ කරයි. එයින් ඔහු ජනයාට අප්‍රිය පුද්ගලයෙක් වේ.

### 10. පරිවාරමදෝ

පිරිවර ඇති බව නිසා සෙස්සන් පහත් කොට තමා උසස් කොට ගන්නා වූ මත් වීම ඇති අධික මානය පරිවාරමද නම් වේ. බොහෝ ශිෂ්‍යයන් දායකයන් ඇති ඇතැම් භික්‍ෂූන්ට හා බොහෝ දූ දරුවන් සහෝදර සහෝදරියන් නෑ මිතුරන් ඇති ඇතැම් ගිහියන්ටත් මේ පරිවාර මදය ඇති වේ. පරිවාරමදයෙන් මත් වූවෝ තමන්ගේ පිරිස් බලය නිසා නොයෙක් පව්කම් කරති. සමහරවිට යම් යම් නොමනා කම්වලට, පිරිසේ සහයෝගය නො ලැබී යාමෙන් අමාරුවට පත් වෙති. පිරිසට අප්‍රිය ද වෙති.

### 11. භෝගමදෝ

''ඇතමකුට සෙට ආහාරවේල සපයා ගැනීමට තරම් මුදලක් අද නැත. මට වනාහි බෙහෝ මුදල් ඇත්තේය. බොහෝ ගෙවල් වතු කුඹුරු වාහන ඇත්තේය. බොහෝ පරිභෝග භාණ්ඩ ඇත්තේය'යි ධනය නිසා ඇතිවන මත් කරන අධික මානය භෝගමද නම් වේ. එයට ධන මදය යි ද කියනු ලැබේ. ධනය වනාහි අන් සෑම කරුණකට ම වඩා මිනිසා මත් කරවන දෙයකි. ධනවත්හු බොහෝ සෙයින් ධනමදයෙන් මත්ව සිටින්නෝය. කලින් දිළිඳුව අය මහා ධනයකින් නොව, මද ධනයකින් ද මත් වෙති. නොයෙක් විට ඒ මත් වීම නිසා ඔහු පමණ ඉක්මවා වියදම් කොට නැවතත් දිළිඳු බවට පත් වෙති. අන් කරුණු වලින් ඇති වන මදයට වඩා ධන මදය නපුරු ය. ධන මදයෙන් මත් වූවෝ සතුන් මැරීම පමණක් නොව මිනී මැරීම ද කෙරෙති. සුළු සොරකම් නොව මහ සොරකම් ද කරති. අධික ලෙස කාමයෙහි වරදවා හැසිරෙති. මහා වඤ්චා කරති. අධික ලෙස සුරා පානය කරති. ගරු කළ යුත්තන්ට ගරු නො කරති. අවමන් කරති. කාරුණිකයන්ගේ අවවාද අනුශාසනයන් නොපිළිගනිති. ධනමදයෙන් මත් වූවන්ට ඉහත දැක්වූ ජාති මදාදි මද ද එකතු වේ. එබැවින් ඔවුන්ගේ මදය සන්සිඳවීමට දුෂ්කර මහා මදයක් වේ. එසේ වී අධික ලෙස පව් කළා වූ ද, දරුණු පව්කම් කළා වූ ද, ඇතැම්හු ඒවායේ විපාක වශයෙන් මෙලොව ද බෝකල් දුක් විඳ මරණින් පසු නරකයට පැමිණෙති. ඇතැම්හු සතුරන් අතින් අකාලයේ මැරෙති. ඇතැම්හු කාමරෝග හා මත්පැනින් වන රෝග සාදාගෙන බොහෝ දුක් විඳ අකාලයෙහි මියෙති. ධනය මනුෂ්‍යයාට අත්‍යාවශ්‍ය දෙයකි. සැම දෙනා විසින් ම ධනය සපයා ගත යුතු ය. ධනයෙන් මෙලොව ලබන සියලු සැප ලැබිය හැකිය. පරලොව සැප ද ලැබිය හැකි ය. එහෙත් එයින් මත් වන නුසුදුසු පරිදි ධනය පරිහරණය කරන පුද්ගලයා මරා දමන්නෙත් අපායට යන්නේත් ඒ ධනය ය. දෙලෝ වැඩ කැමතියෝ මත් නොවී ධනය පරිහරණය කරන්නට දැන ගනිත්වා!

### 12. වණ්ණමදෝ

වර්ණය නිසා මත්වීම ආකාරයෙන් ඇති වන අධික මානය වණ්ණමද නම් වේ. රූප ශෝභාව, ගුණය යන දෙකට ම වර්ණ යි කියනු ලැබේ. ස්ත්‍රීහු රූප ගරුකයෝ ය. තුමූ ලස්සනය කියා බොහෝ සෙයින් මත් වන්නෝ ස්ත්‍රීහු ය. ශරීර වර්ණයෙන් ප්‍රයෝජනය ජනප්‍රිය වීමය. ජනාදරය ලැබීමයි. එහෙත් වර්ණයෙන් මත් ව සිටින කාන්තාව ජනයාට අප්‍රිය, ජනාදරය නො ලබන්නියක් වේ. සිල් ඇත්තියෙක, පණ්ඩිතයෙක, කථිකයෙක, ලෝ සසුන් දෙකට වැඩ කරන්නෙක, කාරුණිකයෙක, ත්‍යාගවන්තයෙක, මේ මේ දෙයට දක්ෂයෙක කියා කීර්තිය පතළ කල්හි, සෙස්සෝ නිර්ගුණයෝ ය. මගේ ගුණ රාශිය ලොව පුරා ඇත්තේ ය කියා ගුණ වර්ණය නිසා ඇත වන වර්ණමද, ස්ත්‍රී පුරුෂ ගිහි පැවිදි කාහටත් වෙනසක් නැතිව ඇති විය හැකි ය.

ඊළඟ සගරාවෙන්...

**13. සූතමදෝ සිට 26. සණ්ඨානමදෝ දක්වා**

අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමියන්ගේ
ලිපියක් ඇසුරිනි.



# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2018. 02. 01 සිට 2018. 06. 30 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

## (ගිණුම් අංකය : 000560001118 - සම්පත් බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව)

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A-24037 | ප්‍රියන්ත පුෂ්පකුමාර මයා | | 100 |
| 14/A-24038 | පරිත්‍යාග | | 100 |
| 14/A-18200-18201 | යානෙත් ඉඳුනිල් මයා | 33-5196 | 200 |
| 14/B-776 | දුල්මිණි චතුරාණි මිය | | 250 |
| 14/C-357 | ඉෂානි විජේතුංග මිය | 32-4980 | 500 |
| 14/C-739 | ඩබ්.බී.ප්‍රනාන්දු මයා | | 500 |
| 14/C-740 | සංජීවනී ප්‍රේමරත්න මිය | | 500 |
| 14/C-42 | ඩී.එච්.චන්ද්‍රවංශ | | 500 |
| 14/C-0748 | ෂනත් අමරසේකර මයා | | 500 |
| 14/C-0749 | තමරා සමරවීර මිය | 09-1972 | 500 |
| 14/C-0750 | සිසිලින් පෙරේරා මිය | | 500 |
| 14/C-376 | පූර්ණිමා ගුනවර්ධන මිය | | 500 |
| 14/C-377 | සචිත්‍රා ජාගොඩ මිය | | 500 |
| 14/C-378 | එම්.ජී.ශ්‍රියාවති මිය | | 500 |
| 14/C-0059 | ප්‍රියංවදා සෙව්වන්දි මිය | 38-5885 | 500 |
| 14/C-060 | තමරා සමරවීර මිය | 9-1972 | 500 |
| 14/C-090 | චමෝදි ශානිකා මිය | 34-5286 | 500 |
| 14/C-0601 | අයි.ජී.එස්.ඉඹුලාන | 3-0713 | 500 |
| 14/C-0602 | කේ.මඩවල මිය | | 500 |
| 14/C-064 | තමරා සමරවීර මිය | 9-1972 | 500 |
| 14/C-0603 | සුමනා ප්‍රේමරත්න මිය | | 500 |
| 14/C-0604 | ජීවන්ති සමරනායක මිය | | 500 |
| 14/A-30376-30381 | ලක්මිණි චතුරි මිය | 10-1927 | 600 |
| 14/A-26026-26032 | නිලංගනී මිය | 32-4938 | 700 |
| 14/A-31001-31008 | දුමින්ද රංගන මයා | 37-5709 | 800 |
| KETA-0599 | ධනුෂ්කා චන්ද්‍රසිරි මිය | 38-5931 | 800 |
| 14/C-41-43 | ජී.චන්ද්‍රවංශ | | 1,000 |
| 14/D-069 | සංජීවනී ප්‍රේමරත්න මිය | | 1,000 |
| 14/D-070 | පී.එම්.සේනාදීර | 11-2014 | 1,000 |
| 14/D-073 | ෂනත් අමරසේකර මයා | | 1,000 |
| 14/D-074 | සිසිලින් පෙරේරා මිය | | 1,000 |
| 14/C-113 | බී.ඩී.සී.කාන්ති මිය | | 1,000 |
| 14/D-084 | ඩබ්.වී.ඩී,චාලට් මිය | 11-1956 | 1,000 |
| 14/D-085 | සන්ද්‍යා රණසිංහ මිය | 23-3612 | 1,000 |
| 14/D-079 | යූ.බී.ප්‍රනාන්දු | 38-5962 | 1"000 |
| 14/D-080 | සංජීවනී ප්‍රේමරත්න මිය | 22-3489 | 1,000 |
| 14/A-17601-17610 | ඒ.ඉන්ද්‍රජිත් මයා | 32-5026 | 1,000 |
| KETA-0619 | පරිත්‍යාග | | 1,000 |
| 14/D-093 | එස්.කේ.ඒ.සිල්වා | 36-5577 | 1,000 |
| 14/D-096 | පී.එම්.සේනාදීර | 11-2014 | 1,000 |
| 14/D-97 | කුරුවිටගේ ආරියවතී මිය | | 1,000 |
| 14/D-98 | අයි.එම්.පෙරේරා | 01-229 | 1,000 |
| 14/D-99 | ඒ.වී.ගමිත් ද සිල්වා මයා | 38-5836 | 1,000 |
| රු.1000 ටිකට් 01 | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 1,000 |
| 14/D-371 | ඊ.ඩී.මල්ලිකා මිය | | 1,000 |
| 14/D-372 | ඩී.එච්.චන්ද්‍රවංස මයා | | 1,000 |
| 14/D-373 | දයා චන්ද්‍රවංස මිය | | 1,000 |
| 14/D-374 | රමන් සමරසේකර මිය | | 1,000 |
| 14/D-375 | අසංග ද සිල්වා මයා | | 1,000 |
| 14/C-0332-0334 | දුමින්ද රංගන මයා | 37-5709 | 1,500 |
| 14/A-29726-29740 | ගාමිඳ මුතුකුඩ මයා | 37-5734 | 1,500 |
| 14/C-744-747 | ඩී.හෙට්ටිආරච්චි | | 2,000 |
| 14ඨa-075-076 | චරිත් වීරක්කොඩි මයා | | 2,000 |
| 14/D-077-078 | මහාචාර්ය ප්‍රේමදාස හැගොඩ මයා | | 2,000 |
| 14/C-11/12 | අරවින්ද අතුකෝරල මයා | | 2,000 |
| 14/C-114/115 | එම්.ජී.ශ්‍රියාවති මිය | | 2,000 |
| 14/D-091-092 | යසින්ත රෂාන් මයා | | 2,000 |
| 14/A-29326-29345 | ශ්‍රියානි රූපසිංහ මිය | 37-5680 | 2,000 |
| KETA-0594 | ඒ.ටී.කුරේ ආයතනයේ සේවක පිරිස | | 2,000 |
| 14/D-94/95 | නිරංජනී ගුණසේකර මිය | 38-5933 | 2,000 |
| 14/A-13076-13095 | චන්දිමා පෙරේරා මිය | 37-5665 | 2,000 |
| 14/A-19476-19495 | සාගරිකා වලිසුන්දර මිය | 33-5090 | 2,000 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| රු.500 ටිකට් 04 | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 2,000 |
| 14/D-100/361 | සංජීවනී ප්‍රේමරත්න මිය | 22-3489 | 2,000 |
| 14/A-29776-29795 | ඒ.පී. චන්ද්‍රසිරි මිය | 37-5729 | 2,000 |
| 14/A-10676-10700 | ඩබ්.එල්.බී.එස්.ලසන්ති මිය | 37-5652 | 2,500 |
| 14/A-13276-13300 | අයි.එම්.සිරිවර්ධන මයා | 1-136 | 2,500 |
| 14/A-25651-25675 | අමිල ද සිල්වා මයා | 33-5184 | 2,500 |
| 14/A-27501-27525 | සදමාලි ජයසිංහ මිය | 36-5572 | 2,500 |
| 14/A-18156-18175 | ඉෂානි විජේතුංග මිය | 32-4980 | 2,500 |
| 14/A-16926-16950 | සජිත් හේවාකුඹුරගේ | 32-4932 | 2,500 |
| 14/A-25501-25525 | සුමුදු වනිගසේකර මයා | 35-5483 | 2,500 |
| 14/A-13576-13600 | සෝමා දීගල්ල මිය | 27-4211 | 2,500 |
| 14/A-27051-27075 | සෝමා දීගල්ල මිය | 27-4211 | 2,500 |
| 14/A-18226-18250 | ජී.යූ.ජී.ගමගේ මයා | 33-5049 | 2,500 |
| 14/A-29826-29850 | අනෝමා සරත්කුමාර මිය | 37-5695 | 2,500 |
| 14/A-30351-30375 | අනෝමා සරත්කුමාර මිය | 37-5695 | 2,500 |
| 14/A-13201-13225 | ඩබ්.පී.එන්.ඩී.විජයපතිරණ මිය | 37-5629 | 2,500 |
| 14/A-13401-13425 | වී.අයූවර්ධන මිය | 20-3218 | 2,500 |
| 14/A-30401-30425 | රන්ජිත් ප්‍රේමලාල් මයා | 37-5756 | 2,500 |
| 14/A-26276-26300 | ජී.එල්.සී.ද,සොයිසා | 30-4625 | 2,500 |
| 14/A-26301-26325 | එල්.අබේසිංහ මිය | 36-5589 | 2,500 |
| 14/A-30201-30225 | ජී.වික්‍රමනායක | 37-3644 | 2,500 |
| 14/A-25701-25725 | කේ.එම්.සුමේද මයා | 15-2553 | 2,500 |
| 14/A-26251-26275 | කේ.එස්.දිල්රුක්ෂි මිය | 36-5555 | 2,500 |
| 14/A-16526-16550 | කේ.හේවාගමගේ මිය | 31-4733 | 2,500 |
| 14/A-24276-24300 | අයෝම ප්‍රියධර්ෂණ මයා | 35-5429 | 2,500 |
| 14/A-27526-27550 | සාවිත්‍රි පෙරේරා මිය | 11-1946 | 2,500 |
| 14/A-27151-27175 | එස්.වික්‍රමසිංහ මිය | 20-3278 | 2,500 |
| 14/A-21451-21475 | චමෝදි ශානිකා මිය | 34-5286 | 2,500 |
| 14/A-13176-13200 | එම්.ජී. ඩී.පී.චාන්දනී මිය | 37-5657 | 2,500 |
| 14/A-21301-21325 | ලෝචනා මිහිරානි මිය | 34-5254 | 2,500 |
| 14/A-24000-24025 | මාලා පද්මිණි මිය | 34-2354 | 2,500 |
| 14/A-25201-25225 | නදීප ප්‍රියංකර මයා | 35-5480 | 2,500 |
| 14/A-30276-30300 | ශෂිකලා කන්දගේ මිය | 36-5596 | 2,500 |
| 14/A-32851-32825 | සුජීව් ජානක මයා | 33-5895 | 2,500 |
| 14/A-29651-29675 | ඩී.සී.විතානගේ මයා | 33-5131 | 2,500 |
| 14/A-3251-3275 | විශාකා රෝරෙටා මිය | 25-3811 | 2,500 |
| 14/A-24200-24225 | චන්ද්‍රානි පෙරේරා මිය | 34-5306 | 2,500 |
| 14/A-32976-33000 | එම්.එච්.ශාන්තිලතා මිය | 38-5815 | 2,500 |
| 14/A-13226-13250 | එච්.ඩී.පී.සේනානායක මිය | 37-5640 | 2,500 |
| 14/A-32376-32400 | ප්‍රසාද් නන්දන මයා | 38-5821 | 2,500 |
| 14/A-16376-16400 | ඩබ්.කේ.රත්නායක මිය | 32-4994 | 2,500 |
| 14/A-27226-27250 | ලලිත් සුනන්ද මයා | 14-2440 | 2,500 |
| 14/A-16551-16575 | සුනන්දවති මාරසිංහ මිය | 32-4989 | 2,500 |
| 14/A-2726-2750 | එම්.බී.ජී.විජේසුන්දර මයා | 30-4611 | 2,500 |
| 14/A-20751-20775 | ඩබ්.කේ.එන්.ආර්,පෙරේරා මයා | 34-5331 | 2,500 |
| 14/A-25301-25325 | කේ.එම්.ආර්.ජයන්ති මිය | | 2,500 |
| 14/A-27001-27025 | විජේතුංග මිය | | 2,500 |
| KETA-0620 | අයෝම ප්‍රියධර්ෂණ මයා | 35-5429 | 2,500 |
| 14/A-25676-25700 | අයි.එන්.ආර්.එස්.ඉලංගකෝන් | 33-5060 | 2,500 |
| 14/A-26626-26650 | නිලූකා ධර්මසේන මිය | 36-5539 | 2,500 |
| 14/A-16951-16975 | ඩී.එම්.නිරෝෂන් මයා | 32-5012 | 2,500 |
| 14/A-25376-25400 | තරංග ප්‍රේමසිරි මයා | 34-5227 | 2,500 |
| 14/A-13051-13075 | ඩබ්ලිව්.කේ.වී.නිර්මාලි මිය | 30-4537 | 2,500 |
| 14/A-32901-32925 | ඩබ්ලිව්.බී.ප්‍රනාන්දු මයා | 38-5962 | 2,500 |
| 14/A-17126-17150 | එච්.එම්.එල්.එස්.ආරියපාල මයා | 37-5664 | 2,500 |
| 14/A-18676-18700 | චන්දික ද සිල්වා මයා | 33-5199 | 2,500 |
| 14/A-29601-29625 | එච්.එම්.එල්.චන්දිමා මිය | 37-5663 | 2,500 |
| 14/A-24151-24175 | සුජීවා දීපානි මිය | 35-5503 | 2,500 |
| 14/A-30326-30350 | නේපාලි මිය | 34-5234 | 2,500 |
| 14/A-24476-24500 | ජී.එස්.ඩී.ධම්මිකා මිය | 29-4461 | 2,500 |
| 14/A-30226-30250 | ටී.එන්.ජී.විරසෙන් මයා | 37-5791 | 2,500 |
| 14/A-19226-19250 | ශාන්ති අමරසේකර මිය | 33-5141 | 2,500 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A-25076-25100 | ඩී.පී.ආර්. දුමින්ද මයා | 35-5407 | 2,500 |
| 14/A-17151-17175 | ශ්‍යාමා නන්දනී මිය | 37-5726 | 2,500 |
| 14/A-25051-25075 | සජාන තෙන්නකෝන් මයා | 33-5172 | 2,500 |
| 14/A-32451-32475 | චාන්දනී පෙරේරා මිය | 38-5808 | 2,500 |
| 14ඒ-32676-32700 | කුසුමා මිය | 38-5938 | 2,500 |
| 14/A-32701-32725 | ප්‍රියන්වදා සිව්වන්දි මිය | 38-5885 | 2,500 |
| 14/A-2351-2375 | පද්මිණී මිය සහ ඩිලාන් මදුරංග මයා | 29-4499 | 2,500 |
| 14/A-27176-27200 | රෝහිනී විජේසිංහ මිය | 35-5421 | 2,500 |
| 14/A-28301-28325 | සනත් සමරසේකර මයා | 38-5818 | 2,500 |
| 14/A-18476-18500 | අසංකා උපුලි මිය | 33-5178 | 2,500 |
| 14/A-6076-6100 | එස්.ඩබ්.පී.විතාන මයා | 30-4558 | 2,500 |
| 14/A-28751-28775 | පුෂ්පා කේ. විජේසිංහ මිය | 37-5561 | 2,500 |
| 14/A-29676-29700 | ධනුෂ්කා චන්ද්‍රසිරි මිය | 38-5931 | 2,500 |
| 14/A-32751-32775 | ප්‍රභා නාවල මිය | 38-5910 | 2,500 |
| 14/A-32826-32850 | ඩබ්.කරදවල | 38-5837 | 2,500 |
| 14/A-26126-26150 | සරත් වීරසිරි මයා | 36-5567 | 2,500 |
| 14/A-32801-32825 | හිරන්‍යා පෙරේරා මිය | 33-5058 | 2,500 |
| 14/A-26601-26625 | චාමර ප්‍රසාද් මයා | | 2,500 |
| KETA-0596 | මෙත්සවිය කමිටු සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 3,040 |
| 14/C-0051-0058 | නිහාල් පුංචිහේවා මයා | 28-4397 | 4,000 |
| 14/C-081-089 | මධුරිත රාජපක්ෂ මයා | 23-3590 | 4,500 |
| 14-E -120 | හේලි අමා සෙනරත් මිය | 5-1039 | 5,000 |
| 14-E -118 | ඉෂානි විජේතුංග මිය | 32-4980 | 5,000 |
| 14-E -119 | චන්ද්‍රමාලා ගුණසේකර මිය | 32-4942 | 5,000 |
| 14/A-13001-13050 | ඩී.ජයදේව මයා | 31-4768 | 5,000 |
| 14/A-25976-26025 | චන්ද්‍ර රම්‍යලතා මිය | 35-5440 | 5,000 |
| 14/A-16651-16700 | චමත් ගුනවර්ධන මයා | 32-4988 | 5,000 |
| 14/A-18651-18675 | | | |
| 27276-27300 | සන්ද්‍යා ජයතුංග මිය | 33-5086 | 5,000 |
| 14/A-24426-24475 | ලලිත් අබේසිරිවර්ධන මයා | 35-5393 | 5,000 |
| 14-E -136 | එම්.ජී.ශ්‍රියාවති මිය | | 5,000 |
| 14-E -137 | එස්.ඩී.එස්.මහීපාල මයා | | 5,000 |
| 14-E -0001 | මධුරිත රාජපක්ෂ මයා | 23-3590 | 5,000 |
| 14-E -0108 | ආර්.එල්.ඒ.කුලතිලක | | 5,000 |
| 14/A-17401-17450 | සුභාෂනී පරමානන්ද මිය | 32-5005 | 5,000 |
| 14/A-33075-33101 | සී.එච්.මානවත්ගේ මිය | 38-5867 | 5,000 |
| 14-E -0109 | එස්.කේ.ඒ.සිල්වා | 36-5577 | 5,000 |
| 14-E -0110 | ශානිකා සමරවික්‍රම මිය | 28-4344 | 5,000 |
| රු.1000 ටිකට් 05 | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 5,000 |
| 14/A-20251-20300 | පී.ආර්.එල්.අබේචන්ද්‍ර | 34-5294 | 5,000 |
| 14/A-18426-18450 | | | |
| 19576-19600 | අජිත් හේමන්ත මයා | 33-5179 | 5,000 |
| 14/E-003 | කේ.සෙනවිරත්න මිය | 38-5946 | 5,000 |
| 555 | දේමුණි පියසීලි මිය | 38-5856 | 6,000 |
| KETA-0595 | මෙත්සවිය කමිටු සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 7,400 |
| 14/C-0761-775 | එල්.අබේසිංහ මිය | 36-5589 | 7,500 |

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| 14/A-24101-24125 | ජයසූරිය මයා | 35-5347 | 7,500 |
| රු.500 ටිකට් 19 | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 9,500 |
| 14-F-030 | වෛද්‍ය යමුනා රණවීර මිය | | 10,000 |
| 14/C-0551-570 | එච්.ඒ.එස්.සුසිල්කුමාර මයා | 18-2966 | 10,000 |
| 14/F-0091 | ආර්.එල්.ඒ.කල්‍යානවති මිය | | 10,000 |
| 14/F-0092 | ඒ.ආර්.ගුණරත්න මිය | 25-3435 | 10,000 |
| 14/A-27301-27325 | | | |
| 27351-27395 | | | |
| 27451-27500 | අංජල වීරසුන්දර මයා | 35-5376 | 10,000 |
| 554 | පී.නවරත්න මිය | | 10,000 |
| 14/F -117 | බුද්ධිකා ප්‍රියධර්ශනී විජේවර්ධන මිය | 38-5887 | 10,000 |
| 14/F -093 | මෙත්සවිය කාන්තා කමිටුව | | 10,000 |
| KETA-0597 | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 12,234 |
| 14/C-201-225 | ලාල් රූපසිංහ මයා | 03-611 | 12,500 |
| 14/C-0401-425 | දුමින්ද විතානගේ මයා | 30-4681 | 12,500 |
| 14/A-31626-31375 | | | |
| 31701-31775 | චේතුක මයා | 35-5457 | 12,500 |
| රු.100 ටිකට් 146 | මෙත්සවිය කමිටු සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 14,600 |
| KETA-0618 | මෙත්සවිය කාන්තා කමිටුව | | 15,020 |
| 14-I-015 | වාසනා ශිරාණි පණ්ඩිත මිය | | 25,000 |
| KETA-0598 | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 34,618 |
| රු.100 ටිකට් 386 | මෙත්සවිය කමිටු සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 38,600 |
| 14-G-093 | නිලූෂා දිල්රුක්ෂි මිය | 31-4783 | 100,000 |
| 14-G-091 | මංගලා පට්ටියකුඹුර නානායක්කාර මිය | | |
| | සහ තෙසත් නානායක්කාර මයා | | 100,000 |
| 14-G-092 | සවිත්‍රී වික්‍රමසිංහ මිය | 20-3278 | 100,000 |
| 14-G-094 | කේ.ඩී.අයි.සී. හෙට්ටිඅරච්චි මිය | 35-5357 | 100,000 |
| 14-G-054 | විජේරත්න මානවඩු මයා සහ | | |
| | නන්දා මානවඩු මිය | | 100,000 |
| 14-G-055 | අනුලා විජයසූරිය මිය සහ | | |
| | කේ.ඩී.විමලසේන මයා | 38-5930 | 100,000 |
| 14-G-095 | රත්න ලියනගේ මයා | 32-4968 | 100,000 |
| 14-G-056 | ස්වර්ණා වර්ණකුලසූරිය මිය | | 100,000 |
| 16/ J-022 | කේ.ඩී.ප්‍රේමවතී මිය සහ | | |
| | බුද්ධික ජයසිංහ මයා | 27-4149 | |
| | | 27-4150 | 101,200 |
| රු.100 ටිකට් 1096 | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 109,600 |
| රු.100 ටිකට් 1148 | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 114,800 |
| | මෙත්සවිය සාමාජිකයන් | | |
| | මහියංගන රාජ මහා විහාරයේදී | | 139,792 |





## සංගරාව මුද්‍රණය කිරීම

මෙත් සවිය මඟින් ප්‍රකාශයට පත් කරන **"මෙත් සවිය සංගරාව"** මුද්‍රණය කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන අතර, **ඒ සඳහා පිංවත් ඔබටත් බරපැන දායක්වය දැරීමට හැකියාව ඇත.** වැඩි විස්තර සඳහා කාර්යාලය අමතන්න.



## මෙත් සවිය ටී ෂර්ට්

**මෙත් සවිය නාමය සහිත, සුදු පැහැති ටී ෂර්ට්** එක **රු. 1000/-** ක් දී මෙත්සවිය කාර්යයාලයෙන් ලබා ගත හැක. මින් ලැබෙන ප්‍රතිලාභ සියල්ල **බුදු පිළිම තැනීම සඳහා සහ පුණ්‍ය කටයුතු සඳහා වැයකරනු ලැබේ.**



### සමථ භාවනාවේ සතලිස් කමටහනෙන් එකක් වන

# අහාරේ පටිකූල සඤ්ඤා භාවනාව

## හෙවත් ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව (ආහාරයෙහි පිළිකුල් සංඥාව) වඩන ආකාරය

ප්‍රාණියෙකුගේ පැවැත්ම සඳහා වන ආහාර වර්ග හතරකි. පැවැත්ම සඳහා සසර කතරින් එතෙර වීම සඳහා ආහාර ගන්නවා යන හැඟීමෙන් තොරව සසර බැඳ තබන තෘෂ්ණාව වැඩෙන ආකාරයෙන් රස තෘෂ්ණාව වැඩෙන පරිදි ආහාර රසයට ගිජුව ඒ සඳහාම වෙහෙසෙන, මුදල් උපයන, හැඟීම මිනිසා තුල අඩු වැඩි වශයෙන් පවතී. ඒ පිළිබඳ දැන්වීම් වලින් ජනමාධ්‍ය පිරී පැවතීම, ආහාර රසය අඩු වූ විට නිවෙස් වල ඇතිවන අඩ දබර ආදිය මීට කදිම නිදසුනක් වේ.

රස තෘෂ්ණාව ප්‍රහීන කරනා නිවනට යන යෝගාවචරයා වැඩිය යුතු වූ ආහාරේ පටිකූල සඤ්ඤා භාවනාව පහත පරිදි දස ආකාරයකින් ආහාරයෙහි පිළිකුල් බව මෙනෙහි කරමින් වැඩිය යුතුය.

## සිව් වැදෑරුම් ආහාර පහත පරිදිය

1. කබලිඩකාරාහාරය
2. ඵස්සාහාරය
3. මනෝ සඤ්චේතනාහාරය
4. විඤ්ඤාණාහාරය

1. ''කබල කොට ගිලිනා අර්ථයෙන් කබලිඩකාරාහාරය යි'' මේ වූ කලී වස්තු (බත් ආදී ද්‍රව්‍ය) සහිත වැ කියන ලදී. ලක්‍ෂණ වශයෙන් නම් ඕජාව යැ. මේ කබලීකාරාහාර සංඛ්‍යාත වස්තුව පෙර කී සේ මේ ශරීරය පවත්වන හෙයින් කබලිඩකාහාරය යි කියනු ලැබේ (අනෙක් ආහාරයන්හි ද ආහාරාර්ථය මෙසේම දතයුතු.)

2. අරමුණු වැදගන්නා සෙයින් ඵස්ස නම් වේ. අරූප ධර්ම වූ ඵස්සය අරමුණෙහි (ස්පර්ශ) වැදගන්නා ආකාරයෙන් පවත්නා හෙයින් ස්පර්ශනලක්‍ෂණායයි කියනු ලැබේ.

3. චේතනය කරනුයේ චේතනා යි, තමා සමග යෙදුනා වූ ඵස්සාදී ධර්මයන් අරමුණෙහි ගළපන්නේය යන අර්ථයි. මනස නම් වූ සිත ඇසුරු කොට පවත්නා චේතනාව මනොසඤ්චේතනාය

4. යුක්ති සැලකීම් වශයෙන් විශේෂයෙන් දැනගන්නා අර්ථයෙන් විඤ්ඤාණ යැ.

මොවුනතුරින් ප්‍රථමය වූ කබලිඩකාරාහාරය තමා පිහිටි රූප කලාපයෙහි ඇතුළත් වූ සෙසු රූපයන්ට ද සුදුසු සේ උපකාර වෙමින් ඔජට්ඨමක රූපය උපදවයි. දෙවැන්න වේදනාව පවත්වයි. තුන්වැන්න ත්‍රිවිධ භවයෙහි ප්‍රතිසන්ධිය පවත්වයි. සිවුවැන්න ප්‍රතිසන්ධික්‍ෂණයෙහි නාම - රූප පවත්වයි.

## ආහාරයෙහි ප්‍රතිකූල සංඥාව වඩන ආකාරය

මෙකී චතුර්විධ ආහාරයන් අතුරින් ආහාරයෙහි පටික්කූල සඤ්ඤාව ඉපදවීමට සුදුසු ආහාරය වූ භෝජ්‍ය ලෙය්‍ය පෙය්‍ය යන සතර වැදෑරුම් ආහාර විකෘති වූ කබලීකාරාහාරය මැ මේ භාවනාවාරයෙහි ආහාරය යි ගැනේ.

එය වඩනු කැමති යෝගාවචර තෙමේ පාළියෙහි ආ පරිද්දෙන් කර්මස්ථානය මනාව ඉගෙන මෙනෙහි කොට අර්ථය වටහා ගෙන එක් පදයකුදු නො වරදවා රහසිගත වැ සිහි ඇති වැ භෝජනාදි පහත පරිදි ආහාරයෙහි දස ආකාරයකින් පිළිකුල් බව ප්‍රත්‍යවෙක්‍ෂා කළ යුතු.

1. ගමනාගමන් වශයෙන්
2. ගෙයක් පාසා සෙවීම් වශයෙන්
3. පරිභෝග වශයෙන්
4. පිත්තාදීන්ට ආශ්‍රය වශයෙන්
5. තැන්පත් වන ස්ථාන වශයෙන්
6. නො පැසීම් වශයෙන්
7. පැසීම් වශයෙන්
8. ප්‍රධාන ඵල වශයෙන්
9. අප්‍රධාන ඵල වශයෙන්
10. ගැල්වීම් ආකාරයෙනි.

**1. ආහාර සෙවීමට යන ගමන් මගෙහි දැකිය හැකි දෑ වන මළකුණු දුගඳ හමන බලු වසුරු ආදී දේ පිළිකුල් බව මෙනෙහි කිරීම.**

මෙසේ මහානුභාව ශාසනයෙහි පැවිදි වූ භික්‍ෂුව මුළු රෑ බුද්ධ වචනය ඉගෙන සජ්ඣායනා කිරීමෙන් හෝ මහණදම් පිරීමෙන් ගතකොට, කල් ඇති වැ නැගිට සෑ මලු - බෝ මලු වත සපයා, පියයුතු පරිභෝග කළ යුතු, පැන් පෙරා තබා ලගිනා ගෙය හැමද සිරුර පිළිදැගුම් කොට අසුනට නැග බොහෝ වෙලා කමටහන් මෙනෙහි කොට ඉන් නැගී, පා සිවුරු ගෙන ජන සම්භාද රහිත උපදි විවේක සැප යැ, සෙවණ හා ජල පහසුව යැ, පිවිතුරු සිසිල් මන වඩන බිම යැ, යන මෙයින් සිත්කලු තපෝ වනය හැර පියා ආයර්‍ය විවෙක සුවය නො බලා, අමු සොහොන වෙත මළකුණු සඳහා යන සිවලකු සේ ආහාර පිණිස ගමට මුව අයා යා යුතුය. මෙසේ යන්නහු ඇඳෙන් හෝ පටුවෙන් හෝ නැගිට තැන සිටි පා දූවිලිය ද, සුහුණු සිකනැල් මල ආදියෙන් ගැවසුණු පා පිස්නද, ඇක්මිය යුතුය. ඇතැම් දිනෙක මී බෙටි වවුල් බෙටි ආදියෙන් ගැවසී හෙයින් ඇතුළු ගබටත් වඩා පිළිකුල් වූ ඉදිරි පෙදෙස ද, බක මුහුණු - පරෙවි ආදීන් ගේ වසුරෙන් අතිශය පිළිකුල් වූ යට මාලය ද, සුළඟින් හැලෙන පැරණි පත්‍ර ද, ගිලන් භික්‍ෂූන් ගේ හා ළදරු

හෙරණුන් ගේ මළමුත්‍ර - සෙම් - සොටු ආදිය ඇති වැසිකල දිය - මඩ - කසළ ආදියෙන් වැඩියක් කිළිටු වූ හෙයින් අතිශයින් පිළිකුල් පිරිවෙන ද, එයටත් වඩා පිළිකුල් වෙහෙරට වදනා මාර්ගය ද, දැක්ක යුතු වෙයි. පිළිවෙලින් බෝධිය හා චෛත්‍යය ද වැඳ විතක මාළකයෙහි සිට මුතු රැසක් බඳු චෛත්‍යය ද, මොණර පිල් කලබක් බඳු බෝධිය ද, බ්‍රහ්ම විමානයක් බඳු සෙනසුන ද, පෙරළා බලා මෙබඳු සිත් කලු ප්‍රදේශයට පිටුපා ආහාරය නිසා යා යුතු නොවේ දැයි සලකා විහාරයෙන් නික්ම ගොදුරු ගමට යන මගට වන් භික්ෂුව කුණුකටු ආදීන් ගැවසීගත් මග ද, වර්ෂා කාලය වුව ජල පහරින් විසම වූ මග ද, බලා අනතුරු වැ ගඩක් වසන්නා සේ අඳනා සිවුර ඇඳ, බෙහෙත් කබලක් මෑත් කරන්නා සේ පාත්‍රය ථවිකායෙන් මෑත් කොට, ගම් දොර සමීපයට වදනහු විසින් ඇත්, අස්, සරක්, මළමිණී, නයි, බලු, කුණු දැක්ක යුතු වේ. හුදෙක් දැක්ක යුතුවා පමණක් නොව නැහැය කඩා යන්නා සේ ඒවායේ දුගඳ ද විඳිය යුතු යැ.

අනතුරුවැ ගම්දොර සිට දරුණු ඇත් අස් උවදුරු බැහැර කරලීම සඳහා ග්‍රාම වීථි බැලිය යුතු වේ. මෙසේ පාපිස්නායෙහි පටන් කුණප අවසන් කොට ඇති නොයෙක් පිළිකුල් දෑ ආහාරය නිසා මැඩිය යුතු ද, දැකිය යුතු ද, ආඝ්‍රාණය කළ යුතු ද වේ යයි මෙසේ ඒකාන්තයෙන් ආහාරය පිළිකුලැ යි ගමන වශයෙන් පිළිකුල් බව සැලකිය යුතු.

**2. ආහාර සෙවීමට ගෙයක් ගෙයක් පාසා පිඬු සිඟා යාමේදී හෝ වෙළඳසලකට හෝ හෝටලයකට යාමේදී දැකිය හැකි පිළිකුල් දේ මෙනෙහි කිරීම.**

එසේ ගමනෙහි පිළිකුල ඉවසා ගමට පිවිස සඟළ පොරවා කබලක් ගත් යාචකයෙකු සේ ගෙපිළිවෙලින් ගම් වීථියෙහි සැරිසරද්දී වැසි කල වුවහොත් පිය තුබූ තුබූ තැන කෙණ්ඩ තෙක් ගොහොරු මඩෙහි පා එරෙයි. එක් අතකින් සිවුර ඔසවා එක් අතකින් පාත්‍රය ද ගෙන ග්‍රීෂ්ම කාලය වුව සැඩ සුළඟින් නැගි පස් - තණ දූහුලියෙන් ගැවසී ගත් සිරුරින් ද යුතු වැ සැරිය යුතු. ඒ ඒ ගෙදොරට පැමිණ මාළු - මස් - වණ - පිළියල් - දෙවු තැන්ද, කෙළ සොටු බලු හුරු මළ ආදීන් මිත්‍ර පණු කැලන් ද, නිල මැස්සන් පිරී අසූචි වළ හා ගවර වළ දැක්ක යුතු ද, මැඩිය යුතු ද වේ. එසේ වන්නා ඒ මැස්සෝ නැගී පා සිවුරු හිස ආදී තන්හි වසති. ගෙට පිවිසියානට ද කිසි කෙනෙක් දෙති. කිසි කෙනෙක් නො දෙත්, දෙන්නාහු ද ඇතැම් හු ඊයේ පිසූ පිළුණු දැය ද කුණු වූ ආදිය ද දෙති. ඇතැම් හු නොදී ''ඇරුනු'' යැයි යෙති. ඇතැම් හු නො දක්නා සේ සිටිති. කිසි කෙනෙක් ඉවත බලති. කිසි කෙනෙක් මුඩු මහණ යව යි පරොස් බස් බෙණෙත්, මෙසේ දුගියකු සේ ගමෙහි පිඬු සිඟා නික්මුණු මනා යැ' යි ගම් වැදීමෙහි සිට ඉන් බැහැරවීම තෙක් අහර නිසා මඩ ගොහොරු ආදිය දැකීම. මැඩීම, ඉවසීම ද, කටයුතුය. පින්වත ඒකාන්තයෙන් ආහාරය පිළිකුලැ' යි මෙසේ අහර සෙවීම පිළිකුල සැලකිය යුතු.

එසේ ආහාර සොයා ගත් මහණ ගමින් පිටත පහසු තැනෙක සුව සේ හැඳැ ඒ ආහාරයෙහි අත තබන්නට පෙර ගරු කටයුතු මහණක්හු හෝ සැලකිය යුතු මිනිසක්හු හෝ දැක ආරාධනා කිරීමට ද පිළිවන් වෙයි. පාත්‍රයෙහි වූ ආහාරයෙහි වළඳනු පිණිස අත එබූ කෙණෙහි 'පිඬු ගනුව' යි කියා නම් මේ තෙමේ මට දෙන්නේ ඉඳුල් දේ හෝයි සැක හා ලැජ්ජා කටයුතු වේ. අහරෙහි අත බහා අණන්නහු ගේ ඇඟිලි දිගේ ඩහදිය ගලා වියළී තද බත ද මොළොක් කරයි.

**3. ආහාර ගන්නා විට ඇනීමෙන් පසු ඇති අශෝභන බව හා මුඛයෙදී කෙල සමග මිශ්‍ර වූ කැබලි වල ඇති ස්වභාවය දැකපිළිකුල මෙනෙහි කිරීම.**

ඇනීමෙන් අහරෙහි පැවති ශොභාව නැති වූවා වෙයි. නැවත පිඩු කොට මුවෙහි තුබූ කෙණෙහි යටි දත් වංගෙඩියකින් කළ යුතු කිස ද සිදු කෙරෙහි. මෙ සේ ඒ ආහාර බලු ඔරුවෙක ලූ බත් පිඩක් සේ මුඛයෙහි දී දත් නැමැති කුල්ලෙන් පොළමින් දිව අග තුබූ පහන් කෙළින් ද, දත් මළයෙන් ද, හනා එකෙණෙහි එහි වූ වර්ණ ගන්ධාදි ශෝභාව මැඩී බලු කැඳ ඔරුවෙක ලූ බලු වමණයක් සේ අතිශය පිළිකුලට පැමිණේ. එසේ වුව ද ඇසට නො පෙනෙන හෙයින් ගිළියි. මෙ සේ වැළඳීමේ පිළිකුල සැලකිය යුතු.

**4. ආමාශයට ආහාරයක් ගිය කල අම්ල පිත්ත හා මුසු වූ ආහාර මෙසේ වේයැයි නුවණින් දැක පිළිකුල මෙනෙහි කිරීම.**

මෙසේ වැළඳූ ආහාර ඇතුළත පිවිසි කල අධික වුව උකු මී තෙලින් මිශ්‍ර කලාක් මෙන් ද, සෙම අධික වුව ඇත් බැබිල කොළ යුෂයෙන් හැනුවාක් මෙන්ද, සැරව අධික වුව කුණු වූ මොහොරුයෙන් මිශ්‍ර කළාක් මෙන් ද, ලෙහෙ අධික වුව පඬුයෙන් හැනුවාක් මෙන්ද, අතිශය පිළිකුලට පැමිණේ. මෙසේ ආසය වශයෙන් පිළිකුල මෙනෙහි කළ යුතුය.

විශේෂ - බුදු, පසේ බුදු සක් විත්තන්ට පිත් සෙම් සැරව ලේ ආසය අතුරින් එකෙක් ම වේ. ත්‍රිහේතුක උත්කෘෂ්ට කුශලයෙන් පිළිසිඳ ලද හෙයිනි. මද පින් ඇතියනට පෙර කී සේ මේ ආසය සතර මැ වේ. එහෙත් එකක් අධික වේ.

**5. වසර සියගණනකින්වත් පිරිසිදු නොකළ වැසිකිළි වලක් බඳු ආමාශයෙහි ආහාර තැන්පත් වන බව නුවනින් දැක තැන්පත් වන ස්ථාන වශයෙන් පිළිකුල මෙනෙහි කිරීම.**

එසේ යම් කිසිවකින් ආශ්‍රය ලැබ බඩ තුළට වදනා ඒ අහර රන් රිදී මැණික් ආදී බඳුනෙක තැන්පත් නොවේ. හුදෙක් දසවස් වූවෙක් වළඳා නම් දස වසකින් නො දෙවූ වැසිකිළි වළක් බඳු, විස් වස් වූවෙක් වළඳා නම් විසි වසකින් නො දෙවූ වැසිකිළි වළක් බඳු, තිස් - සතලින් - පනස් - සැට - සැත්තෑ අසූ - අනූ සියක් වස් වූවෙක් වළඳා නම් සියක් වසෙකින් නො දෙවූ වැසිකිළි වළක් බඳු ආමාශයෙහි පිහිටයි. මෙසේ තැන්පත් වන තැන වශයෙනුදු පිළිකුල වැඩිය යුතු.

**6. අනුභවකල ආහාර බඩවැල් ආදියේ දී සෙම් සමඟ පෙනදමමින් නොදමින් යන නොපැසුන ආහාරයේ ස්වභාවය පිළිබඳ පිළිකුල් බව මෙනෙහි කිරීම.**

එසේ මේ ස්ථානගත ආහාරය නො පැසී සිටිනා තාක් එහි මැ ඝනන්ධකාර වූ නා නා කුණප ගඳින් දුර්ගන්ධ වූ සුළඟ ඇති පෙදෙසෙහි ග්‍රීෂ්ම කාලයෙහි නො කල් වැසි වට කල සැඩොල් ගම් දොර, ගවර වළැ හුණු තණපත් - පැදුරු මාළු - නයිකුණු - බලුකුණු - මිනීකුණු - ආදිය ඉර අව්වෙන් තැවී පෙණ බුබුළුයෙන් ගැවසී සිටුනා සේ ගනාන්ධකාර වූ නාන කුණු ගඳින් දුර්ගන්ධ වූ ප්‍රදේශයෙහි (පක්වාසයෙහි) අද ද ඊයේ ද පෙරේදා ද අනුභව කළ සියල්ල එක් වැ සෙම් පටලයෙන් වෙලී කයෙහි ජඨරාග්නියෙන් තැවීමෙන් නැගුණු පෙණ බුබුලින් ගැවසී ඉතා පිළිකුල් බවට පැමිණ සිටීයැ යි මෙසේ නො පැසීම් වශයෙන් පිළිකුල් වැඩිය යුතු.

**7. ගන්නා ලද ආහාර පැසුණු පසු දිරවා මළ මුත්‍ර ස්වභාවයට පත්වනු දැක ආහාරයේ පිළිකුල් බව මෙනෙහි කිරීම.**

එසේ එහි කායාග්නියෙන් පැසුණු ඒ ආහාරය රන් රිදී ධාතු ආදීන් සේ රන් රිදී බවට නො පැමිණේ. හුදෙක් පෙණ බුබුළු නගමින් ඇඹරුම් ගලෙක අඹරා, නළයෙක පිරූ පඬුවන් මැටි සේ මළ බවට පැමිණ පක්වාසය ද, මුත්‍ර බවට පැමිණ මුත්‍රාසය ද, පුරවයි. මෙසේ පැසීම් වශයෙන් පිළිකුල් බව මෙනෙහි කළ යුතු.

**8. ගත් ආහාරයේ ප්‍රධාන ඵල ලෙස ශරීරයේ කෙස් ලොම් ආදී දෙතිස් කුණප වැඩීම ද, දද කුෂ්ඨ අතීසාරය වැනි රෝග හට ගැනීම ද දැක ආහාරයේ පිළිකුල් බව මෙනෙහි කිරීම.**

එසේ පැසවනු ලබනුයේ ද, කෙස් ලොම් නිය දත් ආදී නොයෙක් කුණප නිපදවයි. නො පැසෙන්නේ දද - කැසිලි - කුෂ්ඨ - පාණ්ඩු - ක්‍ෂය - කාශ - අතීසාරාදී සිය ගණන් රෝග උපදවයි. මෙසේ ආහාරයෙහි ඵල වශයෙන් පිළිකුල් සේ විසිය යුතු.

**9. ගත් ආහාරය ශරීරයෙන් බැහැර වන ආකාරය ගැන මෙනෙහි කර පිළිකුල් බව වැඩීම.**

මේ ආහාරය කන කල එක් දොරකින් ඇතුළට වැද පිටත වැගිරෙන කල ඇසින් අක්‍ෂි ගූථ නම් වු කබ ය, කනින් කර්ණගූථ නම් මළය. යනාදී ප්‍රකාරයෙන් නොයෙක් දොරින් අනේකප්‍රකාර අසූචි භාවයෙන් වැගිරෙයි. වළඳනා කල බොහෝ දෙනා පිරිවරා ද, අනුභව කෙරේ. වැගිරෙන කල මල - මූත්‍ර බවට පැමිණියේ හුදෙකලාව පහකෙරේ. ඒ වලඳනා කල පළමු දවස තුටුපහටු වෙයි. ඔද වඩනේ ද වෙයි. ප්‍රීති වූයේ ද වෙයි. දෙ වන දවස් පහකරනුයේ අතින් වැසූ නැහැ ඇති වැ පිළිකුලින් මුහුණ හකුළුවා මකුවූයේ (අමනාප වූයේ) වෙයි. පළමු දිනෙයහි එහි ආශාවෙන් ගිජු වැ ගැට ගැසූ සේ ඇලී තෘෂ්ණාවෙන් මුසපත් වැ අනුභව කොට දෙ වන දවස්හි එක් රැයක් විසීමෙන් නො ඇලී දුක් වෙමින් පිළිකුල් කරමින් පහ කරයි. එහෙයින් ම

**"අහර පැන් කැවිලි ද - මා ඇඟි නන් බොජුන් හා**
**එක මුව දොරින් පිවිස - නව දොරකින් බැහැර වේ"**

**"අහර පැන් කැවිලි ද - මා ඇඟි නන් බොජුන් හා**
**සපිරිවරින් වළඳා - සැඟවේ බැහැර කෙරනේ"**

**"අහර පැන් කැවිලි ද - මා ඇඟි නන් බොජුන් හා**
**සතුටු වැ හිඳ වළඳනේ - නික්මවනු පිළිකුල් වේ"**

**"අහර පැන් කැවිලි ද - මා ඇඟි නන් බොජුන් හා**
**එක මැ රැයක් ගෙවීමෙන් - කුණුවේ ඒ සියල්ලම"**

මෙසේ බැහැර වන පරදි පිළිකුල් වැඩිය යුතු.

**10. අහාර ගන්නා කල ගැටෙන තැන් වල අත්, තොල්, දිව ආදිය සෝදා වත් ලෙහෙසියෙන් ගඳ ඉවත් කළ නොහැකි බව මෙනෙහි කර ගැල්වීම් වශයෙන් පිළිකුල මෙනෙහි කිරීම.**

මේ අහර වළඳනා කල අත් - තොල් - දිව තලු ආදී තන්හි තැවරී එයින් පිළිකුලට පැමිණ නැවත නැවත සෝදා ද ගඳ හරණා පිණිස නැවත නැවත දෙවිය යුතු වේ. වළඳුයේ ද බත පැසෙන කල බොල් - ඇහි - කුඩු ආදිය ඉතිරි සැළී මුව හා පියන් ගල්වන්නා සේ මුළු සිරුරෙහි පැතිර පවත්නා ජඨරාග්නියෙන් පෙණ දමමින් පැසී උතුරා යන්නේ දතෙහි දත් මල බැවින් ද, දිව - තලු ආදියෙහි කෙළ - සෙම් ආදී බැවින් ද, ඇස් - කන් - නාසා - අධොමාර්ගාදියෙහි කබ - කලාඳුරු - සොටු - මළ - මූ බැවින් ද ගල්වයි. එයින් වැකුණු ඒ ඒ ද්වාරයෝ දිනපතා දොවනු ලබන්නාහ ද පිරිසිදු ද මනහර ද නොවෙති. ඉන් සමහර තැනක් දෙවා අත නැවත ද ජලයෙන් දෙවිය යුතු වේ. සමහර තැනක් දෙවා ගඳ හරනා පිණිස දෙතුන් වරක් ගොමින් හෝ මැටියෙන් හෝ සුවඳ සුන්නෙන් හෝ දොවා ද පිළිකුල හැරිය යුතු වේ. යයි (මෙසේ) ගැල්වීමෙන් පිළිකුල මෙනෙහි කළ යුතු.

මෙසේ දස ආකාරයෙන් පිළිකුල මෙනෙහි කරන්නාහට තර්කයෙන් විතර්කයෙන් පහරන ලද්දාක් මෙන් කරන්නහුට පිළිකුල් වශයෙන් කබලිඞකාරාහාරය ප්‍රකට වෙයි. හෙතෙමේ ඒ නිමිත්ත නැවත නැවත මෙනෙහි කරයි. වඩයි, බහුල වශයෙන් වඩයි. එසේ කරන්නා වූ ඒ යෝගාවචරයා ගේ නීවරණයෝ පහවෙති. කෙලෙස් මුවහවේ. කබලිඞකාරාහාරය පිළිකුල් හෙයින් අපර්ණාවට නොපැමිණෙතුදු උපචාර සමධියෙන් සිත එකගවෙයි. මෙහි පිළිකුල් බව ගැනීම් වශයෙන් සංඥාව ප්‍රකට වෙයි. එහෙයින් ම මේ කමටහන ආහාරයෙහි පටිකූල සඤ්ඤා නම් වේ.

මේ ආහාරයෙහි පටිකූල සංඤ්ඤායෙන් යුක්ත යෝගාවචර භික්‍ෂුවගේ සිත රස තෘෂ්ණාවෙන් හැකිළෙයි. පෙරලෙයි. (පෙරලී වැටෙයි) හෙතෙම කාන්තාරය එතර කරනු සඳහා පුත්‍ර මාංස කන්නකු සේ මද නැතිවැ හුදෙක් දුක් ගෙවීම සඳහා ආහාරය වළඳයි. එකල කබලිඞකාරාහාරය පිරිසිඳ ගැනීම් වශයෙන් අනායාසයෙන් මැ පඤ්චකාම ගුණ පරිඥා මුඛයෙන් රූපස්කන්ධය පිරිසිඳ දැනීම වෙයි. හෙතෙම පඤ්චකාම ගුණ පරිඥා මුඛයෙන් රූපස්කන්ධය පිරසිඳ ගනී. අපරිපක්වාදි ප්‍රතිකූලභාව වශයෙන් ඔහු ගේ කායගතාසති භාවනාව ද පිරීමට නොයෙයි. ඉන් පිළිකුල් බව සැලකීමෙන් අසුබ භාවනාවට අනුලොම් වූ ප්‍රතිපත්තියට පැමිණියේ වෙයි. මේ ප්‍රතිපත්තිය ඉහාත්මයෙහි නිර්වාණය අවසන් කොට ඇත්තේ වෙයි. නිවන පිණිස වෙයි. මේ භාවනාව වඩා ඉපදවූ උපචාරධ්‍යානය පාදකකොට විදර්ශනා වඩා සතර මාර්ග ඵලයන්ට පැමිණ නිවන් අවබෝධ කළ හැකිවේ. ඉහතාත්මයෙහි එසේ නොවී නම් සුගතියක පහළ වීමට හේතුවෙයි.

- විශුද්ධි මාර්ගය ඇතුළු පතපොත ඇසුරිනි -
**මහාචාර්ය චන්දන ජයරත්න විසින් සකස් කරන ලදී.**

---

**සුව සෙත**

ප්‍රාණ / විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් පුද්ගලයින් විසින් රෝග සුවයට උපකාර කිරීම නොමිලයේ පැවත්වෙන සුව සෙත වැඩසටහන ඉරු දිනවල දී, පෙ.ව. 11.00 - ප.ව. 2.00 දක්වා (මාසයේ පළමු ඉරු දින හැරෙන්නට) ශ්‍රී විජයාරාමයේ දී පැවැත්වේ. කාර්යයාලයෙන් විමසා පැමිණෙන්න.

# වීර්‍ය පාරමිතාව පුරන්නට පෙර

භාවනා කිරීම සඳහා වීර්‍ය අත්‍යාවශ්‍යය. වීර්‍ය පාරමිතාව පූරණයට පෙර වීර්‍ය ඇති වීමේ හේතු, කුසීත වස්තු අට, ආරම්භක වස්තු අට ආදිය දැනගත යුතුය.

## වීර්‍ය ඇතිවීමේ හේතු එකොළහක් ඇත.

1. **අපාය භය සිහිකිරීම.**
2. **වීර්‍යයෙහි අනුසස් දැකීම.**
3. **බුද්ධාදී උතුමන්ගේ ගමන් මඟ මෙනෙහි කිරීම.**
4. **අනුන්ගෙන් ලැබෙන ආහාරය ගැන සැලකීම.**
5. **තම උරුමයේ උසස් බව මෙනෙහි කිරීම.**
6. **තම ශාස්තෘවරයාගේ උසස් බව මෙනෙහි කිරීම.**
7. **ජාතියේ මහත් බව නැවත නැවත සිහිකිරීම.**
8. **සබ්‍රහ්මචාරීන්ගේ උසස් බව මෙනෙහි කිරීම.**
9. **අලස පුද්ගලයන් බැහැර කරන බව සිහිකිරීම.**
10. **පටන් ගන්නා ලද වීර්‍ය ඇත්තවුන් ඇසුරු කිරීම.**
11. **වීර්‍යය ඇතිකර ගැනීමට නැඹුරු වූ සිතක් තිබීම.**

යමෙකු වීර්‍ය වැඩීමට හේතු වන්නේ ඉහත කරුණු එකොළහය. එමෙන්ම යම්කිසි අරමුණක් කරා යාමේදී වීර්‍ය නැතිවීමට හෝ පටන්ගත් වීර්‍ය හීනවීමට බලපවත්වන කරුණු අටක් කුසීත වස්තු නමින් දැක්වේ. අංගුත්තර නිකායේ සඳහන් පරිදි කුසීත වස්තු අට පහත පරිදිය.

## කුසීත වස්තු අට

1. කිසියම් වැඩක් සිදුකිරීමට තිබිය දී එයින් ඇතිවන වෙහෙස පිළිබඳව පූර්ව නිගමනයකට පැමිණ නිදා ගැනීම.
2. කිසියම් වැඩක් කොට වෙහෙසී මාගීඵලාදිය පිණිස වීර්‍ය නොකරම නිදා ගැනීම.
3. ගමනක් යෑමට ඇති කල්හි ඒ ගැන සිතා මාගීඵලාදිය පිණිස වීර්‍යය නොකර නිදා ගැනීම.
4. ගමනක් ගොස් පෙරලා පැමිණ වෙහෙස යැයි මාගීඵලාදිය පිණිස වීර්‍යය නොකර නිදා ගැනීම.
5. සෑහෙන පරිදි ආහාර නොලැබ කායික ශක්තිය නැතැයි මාගීඵලාදිය පිණිස වීර්‍ය නොකර නිදා ගැනීම.
6. සෑහෙන ලෙස ආහාර ගෙන කායික බර වැඩියැයි මාගීඵලාදිය පිණිස වීර්‍යය නොකර නිදා ගැනීම.
7. මඳක් රෝගාතුර වූ විට අසනීප යැයි මාගීඵලාදිය පිණිස වීර්‍ය නොකර නිදා ගැනීම.
8. රෝගය සුව වූ පසු එකෙණෙහිම වැඩ කිරීමට නොහැකි යැයි මාගීඵලාදිය පිණිස වීර්‍ය නොකර නිදා ගැනීම.


මේ හැම වස්තුවකින්ම කියැවෙන්නේ මිනිසා තුළ ඇති මන්දෝත්සාහී ගතියයි. මෙවන් පුද්ගලයන්ට කිසිදා වීර්‍ය පාරමිතාව වැඩිය නොහැකිය. බුදුරජාණන් වහන්සේ පරාභව සූත්‍රයේ දී දේශනා කරන්නේ නිද්‍රාශීලී, සභාශීලී මෙන්ම අනුත්සාහවත් පුද්ගලයා පිරිහෙන බවයි. එසේ නම් මේ අයුරින් මන්දෝත්සාහී නොවී තම අරමුණකරා යාමේ දී වීර්‍ය ආරම්භ කළ යුතුය. ඒ සඳහා ආරම්භක වස්තු අටක් වේ.

## ආරම්භක වස්තු අට

1. වැඩක් කළ යුතුව ඇති කල්හි මට වැඩක් කරන්නට ඇත්තේය, වැඩය පටන්ගත් කල්හි මට බුදුන් වහන්සේගේ අනුශාසනය සිහි කිරීම අපහසුය, ඒ නිසා මා විසින් දැන් දැන්ම වීර්‍යකොට මාර්ගඵලාදියට පැමිණිය යුතුය.
2. වැඩක් සිදුකොට අවසන් වූ කළ වැඩය අතරතුර බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය සිහිකිරීමට නොහැකි විය. ඒ නිසා දැන්ම අරමුණු ලඟාකර ගැනීමට යොමු වී, වීර්‍යකොට මාර්ගඵලාදියට පැමිණිය යුතුය.
3. ගමනක් යෑමට ඇති කල්හි මට ගමනක් යෑමට ඇත්තේය, ඒ අතරතුර මට බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කිරීම පහසු නැත. ඒ නිසා දැන්ම අරමුණු ලඟාකර ගැනීමට යොමු වී, වීර්‍යකොට මාර්ගඵලාදියට පැමිණිය යුතුය.
4. ගමනක් ගොස් නිමාවූවිට ගමන යනවිට මට බුදු රජාණන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කිරීමට නොහැකි විය. ඒ නිසා දැන්ම වීර්‍යකොට මාර්ගඵලාදියට පැමිණිය යුතුය.
5. සෑහෙන ප්‍රමාණයකට ආහාරයක් නොලද කල්හි දැන් කය සැහැල්ලුය, දුබල වීමට පෙර වීර්‍යකොට මාර්ගඵලාදියට පැමිණිය යුතුය.
6. සෑහෙන පමණ ආහාරයක් ලද කල්හි මාගේ කය ශක්තිමත්ය, ඒ නිසා අරමුණු ලඟාකර ගැනීමට යොමු වී, වීර්‍යකොට මාරගඵලාදියට පැමිණිය යුතුය.
7. සුළු රෝගයක් හටගත් කල්හි මේ රෝගය උග්‍ර වුවහොත් මට බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කිරීමට නොහැකිය ඒ නිසා දැන්ම අරමුණු ලඟාකර ගැනීමට යොමු වී, වීර්‍යකොට මාර්ගඵලාදියට පැමිණිය යුතුය.
8. රෝගාතුරවී සුව වූ විට රෝගය වැළඳී සිටි කාලයේ බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කිරීමට නොහැකි විය. ඒ නිසා දැන්ම අරමුණු ලඟාකර ගැනීමට යොමු වී, වීර්‍ය වඩා මාර්ගඵලාදියට පැමිණිය යුතුය.

ඉහත කරුණු පිළිබඳව මනා දැනුමක් වීර්‍ය පාරමිතාව පූරණයට පෙර ලබාගත යුතුය.

**පූජ්‍ය කුට්ටිවල අනුරුද්ධ හිමිගේ ලිපියක් ඇසුරින් සකස් කොට ඇත.**



# සිත් තුළින් පිදුම් ලත් වදන්

චන්දන මහ ඇදුරුතුමනි

විටෙක ඔබ අපට මවකි, පියෙකි,
විටෙක ගුරුවරයෙකි, විටෙක දෙවියෙකි,
විටෙක සෘෂිවරයෙකි,
සෑම විටම ඔබ ශ්‍රේෂ්ඨ උතුමෙකි
අපගේ ජීවිත අපායක් වූ සෑම විටම
එය සුරලොවක් කර දුන්නේ ඔබයි.
අප අසරණ වූ සෑම මොහොතකම
අපට පිහිට වූයේ ඔබයි.
ජීවිතයේ අරුත කියාදී
අපගේ මනස, නැණස, පෑදුවේ ඔබයි
ගුරුපියාණෙනි.
ඔබට ගෞරව කිරීමට තරම්
ත්‍යාගයක් අපට ලැබී නැත.
ඔබට නීරෝගී සුවය, දීර්ගායුෂ,
තව තවත් රටට සේවය කිරීමේ හැකියාව ආදී
ඔබතුමාගේ සියලු කටයුතු
දිනෙන් දින වැඩි දියුණු වේවායි!
ඉතසිතින් පතමි ගුරු පියාණෙනි!
අපගේ මුලු හදවතින්ම පතමි
ඔබට දීර්ඝායුෂ ලැබේවා !
ඔබ මතු උපදින ආත්මයක
ලොව්තුරා බුදුබව ලැබේවා !

23 - 3583



### නියමුවානණි ශක්තියේ

නිමල වූ බුදු සසුන
රැකගන්න වෙර දරන
පිරිස් බල බිහි කරන
මැතිඳුන්ට චන්දන
දීඝායු නිදුකින
පතමු අසරණ සරණ
කමිටු දන මෙත් සිතින

පිංබිමේ පුදබිමේ - වැව් බිමේ විල්ලුවේ
එල දරන ශක්තියේ - බුදු පිළිම වහන්සේ
ගුවන්ගැබ තලාවේ - එකළු වී තැනෙන්නේ

නියමුවානෙණි ඔබේ - වටා ඇති ශක්තියේ
පිරිස් බල ශක්තියේ - මුතු කැටයි දහඩියේ

අසරණ සරණ කමිටු සභාපතිනිය

දමනය කරන්නට
මහා ගැටුමන් ඇති හදවතට
විචාරය කොට ධර්මය
ආර්ය ගුණ වඩන්නට
දැයිට මං හුරු කරන්නට ඔබ තුමන් ගන්නා වෙහෙස
වචන මදි කියන්නට...
අන් අය අභිබවායන ඔබේ මිනිසත් ගුණය ගැන
වඳිනක් පවසන්න මට අවසර ද? ...
දනට, පිනට බැඳි ඔබේ හද
විජ්යගත් බොහෝ උගතුන්ට අමතක වූ යුතුකම් මව් බිමට ඉටුකොට
සියි දනන් වෙත තව තවත් කරනා මෙම මෙහෙයට
සරසවි ඇදුරු කමිනුත් ඔබ්බට
ගත් වෙහෙස අති උත්තමයි
යනි සසර මඟ පුරාවට ඔබ වෙතට, අප සැමද එගොඩ කොට

රසික කොඩිකාර 39/6052



# නිරවුල් මනසේ සැබෑ අසිරිය

මිනිසාට ඇති බලවත් ම ශක්තිය චිත්ත ශක්තියයි. ලොව ඇති විස්මිත සියළු නිර්මාණයන් ලෝකයාට දායාද කළේ මිනිස් සිතෙක නිර්මාණය වූ ක්‍රියා පිළිවෙළක ශ්‍රේෂ්ඨ ප්‍රතිඵලයෙකි.

ජාත්‍යන්තර ප්‍රජාව ආධ්‍යාත්මික නායකයෙකු වශයෙන් හඳුන්වන ටිබෙට් ජාතික දළයි ලාමා තුමා කළ ප්‍රකාශයක් කාගේත් යහපත පිණිස සටහන් කරමි.

මම මනුෂ්‍යයෙකු හමුවූ විටෙක ඔහුගේ ජාතිය හෝ ආගම හෝ වර්ණය ගැන මා නොසිතමි. නමුත් මට හැඟෙන්නේ මගේ මිනිස් පවුලේ සාමාජිකයකු මට මුණගැසුණ බවයි.

ඒ පූජනීය ආධ්‍යාත්මික දහම් මිතුරන් අපට ඇසුරට නොලැබීම අපගේ අභාග්‍යයකි.

අපවත් වී වදාළ මහා ජ්‍යේෂ්ඨ ගුරු අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහා නායක මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ද කර ඇති පහත සඳහන් ප්‍රකාශය තුළින් ද මා දුටුවේ දියුණු චිත්ත මට්ටමක ස්වරූපයකි.

මේ ලෝකය එකම රටක් ලෝකය මගේ රට. මා එහි රටවැසියෙක්. අප එකම මනුෂ්‍යය සමාජයක් එකම පවුලක්. අපි කවුරුත් ඒ සමාජයේ සාමාජිකයෝ. මාගේ දර්ශනය මේකයි.

කරදර ප්‍රශ්න ගැටළු කම්කටොළු බොහෝ විට නිර්මාණය කරගෙන ඇත්තේ අප විසින්මය. මේ සියල්ලටම වගකිව යුත්තෙක් ඇත. ඔබට වගකිව යුත්තා ඔබමය. පාලනයක් නැති පරීක්ෂාවට භාජනය නොවන සිතිවිලි හා නානාවිධ අරමුණු නිසා කාම චිත්ත සන්තානය තුළ නිර්මාණය කර ගන්නා නොයෙකුත් ආවේගයන්, ආරවුල්, අර්බුද වලින් මොහොතක් මොහොතක් පාසාම සිතට ඇතිවන පීඩාව වේදනාව කම්පනය දුක නිසා මානසිකව පමණක් නොව කායිකවද තමා රෝගියකු බවට පත්වේ. ඉතාම භයානක කම නම් මේ භවයේ පමණක් නොව සසර පුරාද මේ දුක භුක්ති විඳීමට ඔබ අයිතිකරුවකු බවටද පත්වේ. ඒ නිසා ඔබට වද දෙන පීඩා දෙන සිතිවිලි හා අරමුණු වලට මනසින් ඔබ සම්බන්ධ නොවී සිටිය යුතුයි. සමහරු සිත එහා මෙහා ගමන් කරන බව ප්‍රකාශ කරති. සැබැවින්ම එවා එසේ නොවේ. සිදුවන්නේ ඊට වඩා හාත්පසින්ම වෙනස් දෙයකි. ඇස, කණ, නාසය, දිව, ශරීරය ආදී ඉඳුරන් ගෙන් ගන්නා අරමුණු අනුව ඒ ඉඳුරන් හා ඇලෙන ගැටෙන ස්වභාවය අනුව සිතේ පවත්නාවූ චිත්ත ස්වරූපයන් අනුව නිර්මාණය කරගන්නාවූ හා ගොඩ නගා ගන්නාවූ මනෝ ලෝකය තුළ මෝහනය වී කටයුතු කිරීම නිසා නොදැනුවත්වම දුක් හෝ ගිනිගොඩවල් වලට හසුවීම පුහුදුන් ස්වභාවයකි. දමනය නොකළ නිවීමේ අයිතිය නැති සිතක ස්වභාවයකි.

නිරතුරුවම අභ්‍යන්තර පරීක්ෂාවක් ඇත. මනසේ සිතුවිලි පාලනයක් ඇති තම ඉඳුරන්ට හසුවන ගොදුරු ගැන විමසිලිමත් පරිපාලනයක් හා බුද්ධිමත් කළමනාකරණයක් ඇති සැදැහැතිය මනා සිහියකින් කටයුතු කරයි. එමනිසා ආරවුල් වෙනුවට නිරවුල්, අසහනය වෙනුවට සහනය, අර්බුදය වෙනුවට සාමය ඔහුට හෝ ඇයට හිමිවේ.

බොහෝ විට අප බොහෝ දේ ගැන විමසිලිමත්වීම හා සුපරීක්ෂාකාරීවීම සැබෑය. එහෙත් අප අපගේ සිත් දෙස එබී බැලීමක් පරීක්ෂාකාරීවීමක්, විමසිලිමත් වීමක් නොමැති නිසා භයානක ඉරණමකට මුහුණ දීමට සිදුවනු ඇත.

පසිඳුරන්ගෙන් ගන්නා අරමුණු අනුව ඒ සෑම මොහොතකම කැමති ඇලෙන හා අකමැති ගැටෙන සිතිවිලි ඇතිවීමක් පැවතීමක් නැතිවීමක් සිදුවන බව චිත්ත විවේකයෙන් නිහඬව ද අවබෝධයෙන් දැකිය හැකිය.

සිතෙන් සිත දැකීම ශ්‍රේෂ්ඨ මානසික අභ්‍යාසයෙකි. මේ සඳහා මනා ලෙස පිහිටුවා ගත් සිහිය ඉතා වැදගත්ය. ඒ මොහොත තුළදීම යම් සිතුවිල්ලක පවත්නා යථා ස්වභාවය හෙවත් සැබෑ සමරූපය වන අස්ථිරභාවය හෙවත් අනිත්‍යභාවය, මේ නිසාම ඇතිවන සිතෙහි පීඩාව හෙවත් දුක් ස්වභාවය හා අනාත්ම ස්වභාවය තමාට අවබෝධ කර ගැනීමට හැකියාව ලැබේ.

නිරවුල් මනසක් දායාද කරගත්තාවූ චිත්ත පාරිශුද්ධත්වයේ ශ්‍රේෂ්ඨත්වයට පත්වූ මානසික පවිත්‍රත්වයේ ඉහළම මට්ටමට පත්වූ සියලු කෙලෙස් ගිනිවලින් සිත ආරක්ෂා කර නිවාගත්තාවූ මුළු ලෝවැස්සන්ටම චිත්ත සාමයේ අගය ආදර්ශයෙන්ම පෙන්වා වදාළ සම්මා සම්බුදුරජාණන්වහන්සේ අපට කියා දුන් ශ්‍රේෂ්ඨ පාඩම සිත දියුණු කර ගැනීමේ, සිත නිරවුල් කර ගැනීමේ හෙවත් සිත නිවා ගැනීමේ පාඩමයි.

අශෝකා හේමමාලී ජයතිලක 08-1510

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ

# 15 වන සංවත්සර වාර්තාව

වර්ෂ 2018 ක් වූ ජූනි මස 03 වන ඉරු දින ප.ව. 1.30 ට කොළඹ - 05 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ දී මෙත් සවිය සංසදයේ 15 වන මහා සමුළුව හා මෛත්‍රී භූෂණ සම්මාන උළෙල උත්කර්ශවත් අයුරුන් ඇරඹුණි.

උත්සවයේ මුලසුන හෙබවීමට නියමිතව සිටි අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහා නායක අතිපූජ්‍ය **කොටුගොඩ ධම්මාවාස** මහා නාහිමියන්ගේ ගෞරවණීය වැඩම කරවීම සිදු විය.

උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගරු **මෛත්‍රීපාල සිරිසේන මහතා** සහ බුද්ධ සාසන අමාත්‍ය **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා** පැමිණියේය.

ගරු ජනාධිපතිතුමාව මෙත් සවිය මෛත්‍රී සංසදයේ ගරු සභාපති නාලන්දා කීර්ති ශ්‍රී, ශාසන දීපන, විද්‍යාකීර්ති, මහාචාර්ය චන්දන ජයරත්න මැතිදුන් සහ එතුමාගේ දියණිය විසින් බුලත් හුරුළු පිළිගන්වා සාදරයෙන් පිළිගන්නා ලදී. ඉක්බිතිව සම්භාවණීය ආරාධිත අමුත්තන් විචිත්‍රවත් පෙරහරකින් සභා ගැබට කැඳවා ගෙන එන ලදී. අනතුරුව උත්සවයේ සමාරම්භය සනිටුහන් කරමින් පොල්තෙල් පහන දැල්වීමේ අවස්ථාව උදා විය.

අතිගරු ජනාධිපතිතුමා **"මෙත්සවිය"** ගරු සභාපති, සම්මානලාභී පොලිස්පතිතුමන්, සම්මානලාභී වෛද්‍යතුමන් ඇතුළු සම්භාවණීය අමුත්තන් විසින් පොල්තෙල් පහන දැල්වීම සිදු කරන ලදී.

ඉන්පසුව අමරපුර සංඝසභාවේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහා නාහිමියන් විසින් මුලසුන හොබවමින් සභාව අජීව අෂ්ඨමක ශීලයේ පිහිටුවන ලදී. ඉන්පසුව අපවත් වී වදාල මෙත්සවිය හිටපු අනුශාසක අතිපූජ්‍ය **අහංගම ආනන්ද නාහිමියන්** සිහිකිරීම පිණිස විනාඩියක නිශ්ශබ්දතාවයක් පැවැත්විණි. ඉක්බිතිව පැමිණ සිටි පිරිස මෙත් සවිය තේමා ගීතය ගායනා කිරීමෙන් අනතුරුව උත්සවයේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

ඉන් අනතුරුව මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන් විසින් පිළිගැනීමේ සටහන තබමින් මහා සංඝරත්නය ප්‍රමුඛ පැමිණි සිටි පිරිස පිළිගන්නා ලදී. පිළිගැනීම අවසානයේ දී අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමියන්ට පිං පිණිස ආබාධිත පුද්ගලයෙකු හට රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී. ඉන් අනතුරුව හොරණ විදුසිළු රංගායතනයේ දරුවන් විසින් විචිත්‍රවත් සංස්කෘතිකාංගයක් ඉදිරිපත් කරන ලදී. අනතුරුව මෙත් සවිය සංසදයේ අනුශාසක රත්මලානේ මල්ලිකාරාමාධිපති රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකවේදී, **රනස්ගල්ලේ ඥාණවීර ස්වාමීන් වහන්සේ** විසින් අනුශාසනාවක් කරන ලදී. පසුව මෛත්‍රී භූෂණ සම්මාන ප්‍රධානය කිරීමේ අවස්ථාව ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය.

මෙත් සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ට සේවය සහ ප්‍රවීනතාව උදෙසා පිරිනැමෙන මෛත්‍රී භූෂණ ගෞරව සම්මානය රද්දොළුගම, කුස්වල ශ්‍රී පුෂ්පාරාම මහා විහාරාධිපති **පූජ්‍ය මහඇලගම ලංකානන්ද ස්වාමීන් වහන්සේ** වෙත අතිගරු ජනාධිපතිතුමන්ගේ සුරතින් ප්‍රධානය කිරීමට යෙදුණි. දෙවනුව මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර විශිෂ්ට සේවය හා ප්‍රවීනතාවය උදෙසා පිරිනැමෙන මෛත්‍රී භූෂණ ගෞරව සම්මානය යක්කල, අළුත්ගම්ගොඩ, ස්වාශ්‍රමයේ **දේශීය වෛද්‍යශූරී රුවින්ද මාරසිංහ මැතිදුන්** වෙත ගරු ජනාධිපතිතුමන්ගේ සුරතින් ප්‍රධානය කිරීමට යෙදුණි.

ඉන් අනතුරුව ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ ගිහි පිංවතුන් උදෙසා පිරිනැමෙන විශේෂ ගෞරව සම්මාන පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා වෙත ගරු ජනාධිපතිතුමාගේ සුරතින් ප්‍රධානය කිරීමට යෙදුණි. අනතුරුව අතිගරු ජනාධිපතිතුමන් වෙත මෙත්සවිය සංසදයේ ගරු සභාපති චන්දන ජයරත්න මැතිතුමා විසින්, මෙත්සවිය මගින් මහියංගණය පූජාභූමියේ ඉදිකරනු ලබන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමාවහන්සේගේ අනුරුවක් සහ විශේෂ සමරු සිහිවටනයක් පිළිගන්වන ලදී. පසුව හොරණ විදුසිළු රංගායතනය මගින් විචිත්‍රවත් රංගනයක් ඉදිරිපත් කරන ලදී. ඉන් පසුව සම්මානලාභීන් විසින් මෙවැනි සම්මාන පිරිනැමීමේ වැදගත්කම පසක් කරමින් කෙටි දේශණයන් පවත්වන ලදී. ගරු බුද්ධ ශාසන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා විසින් එතුමාගේ දේශනය සිදුකරන ලදී. අනතුරුව මෙත්සවිය සංසදයේ උන්නතිය උදෙසා තම ශ්‍රමය, ධනය, කාලය කැප කරමින් සුවිශේෂ වූ සේවාවන් සිදුකරන ලද කරඳවල මහතාට, නෙරංජලා නනායක්කාර මහත්මියට, සරත් මෙන්ඩිස් මහතාට, ලිවිංස්ටන් දහනායක මහතාට, ප්‍රදීප් යහම්පත් මහතාට, සමන්ති අනුබුදු මහත්මියට, රජිව් ගුණසේකර මහතා ඇතුළු මහත්ම/මහත්මීන්ට මෙත්සවිය වෙනුවෙන් කරන ලද සේවාව අගයමින් සම්මාන පිරිනැමීම සිදු විය.

ඉන්පසුව මුලසුන හොඹවමින් වැඩවිසූ අමරපුර සංඝසභාවේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහා නායක හිමියන් විසින් කෙටි දේශනාවක් පවත්වන ලදී.

ඉක්බිතිව මෙත්සවිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව ලබන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් පිරිසකට ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම සිදු කරන ලදී. අනතුරුව 15 වසරක් අඛණ්ඩව තම සාමාජිකත්වය පවත්වාගෙන පැමිණි සාමාජික සාමාජිකාවන්ට සහතික පත් ප්‍රධානය මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් සිදු කරන ලදී. ඉන් අනතුරුව බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීමට රුපියල් ලක්ෂයකට වැඩි ආධාර ලබාදුන් පිංවතුන් උදෙසා බුද්ධ ප්‍රතිමාවහන්සේගේ අනුරුවක් ප්‍රධානය කිරීම **ගොරකානේ චතුර ස්වාමීන් වහන්සේ** අතින් සිදුවිය. අනතුරුව මෙත්සවිය කමිටු සඳහා පැවැත්වූ නායකත්ව පුහුණු වැඩසටහන සාර්ථකව නිම කළ සාමාජික/සාමාජිකාවන් හට සහතික පත්‍ර පිරිනැමීම ස්පියර්ස් සමාගමේ ප්‍රධානී **ප්‍රදීප් යහම්පත් මැතිතුමා** විසින් සිදු කෙරුණි.

අනතුරුව මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් ස්තූති කථාව සිදු කරන ලදී. ඉන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව 15 වන සංවත්සරය සහ මෛත්‍රීභූෂණ සම්මාන උළෙලේ වැඩ කටයුතු නිමාවට පත් කරන ලදී.

---


**වසර 15 ක් තුල 6000 කට අධික සාමාජිකත්වයකට භාවනා පුහුණුකල මෙත්සවියේ**

**40 වන ත්‍රෛමාසික චිත්ත සංයමය අභ්‍යාස හා භාවනා වැඩසටහනට**

**2018 නොවැම්බර් 18 දින පියතබන වගයි.**

**මෙත් සවිය**

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

**මඟින් පවත්වනු ලබන මෙම වැඩසටහන තුලින් සම්ප්‍රදායානුකූල බෞද්ධ භාවනා ක්‍රම සහ ලොව පවතින විවිධ භාවනා ක්‍රම කිහිපයක් හඳුන්වාදෙනු ලැබේ.**


**අන් භාවනා ක්‍රම වලට වඩා බෞද්ධ භාවනා වල ඇති හරය මෙතුලින් ඔබට පසක් වනු ඇත.**

**මෙම වැඩසටහන ක්‍රමවත්ව සකසා මෙහෙයවනු ලබන්නේ ප්‍රවීන භාවනා කම්මට්ඨානාචාර්ය විශ්ව විද්‍යාල ඇදුරුතුමෙකු විසිනි.**

මෙහිදී - සමථ භාවනා ක්‍රම, බුද්ධානුස්සති භාවනාව, මෛත්‍රී භාවනාව, දස කසිනය, පිළිකුල් භාවනාව, මරණානුස්සතිය, දස අශුභය, විදර්ශනා භාවනාව, සක්මන් භාවනාව, බුරුම සහ සියම් භාවනා ක්‍රම, ටිබෙට් හා යෝග භාවනා ක්‍රම හැඳින්වීම, බටහිර මනෝ විද්‍යාවේ සංයම අභ්‍යාස (Relaxation Techniques) හා NLP ක්‍රම හැඳින්වීම, සිතෙහි ඇල්ෆා අවස්ථාව භාවිතයෙන් ලෞකික ජීවිතයේදී සාර්ථකවන ක්‍රම, භාවනාව තුලින් රෝග නිවාරණය වන අන්දම, සතුරන්ට මුහුණ දෙන ක්‍රම, අධ්‍යාපනය සඳහා ධාරණ ශක්තිය වැඩි කරගන්න අන්දම, අනිමිතලෝචන භාවනාව, අටලෝදහම භාවනාව, දෑස් විවෘතව කරන Open eye meditation techniques, පරමොත්කෘෂ්ඨ (TM) භාවනාවට සමාන භාවනා ක්‍රම හඳුන්වා දීම ආදිය.

**ගරු ලේකම්, මෙත්සවිය භාවනා මධ්‍යස්ථානය, ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, වැල්ලවත්ත, කොළඹ 06.**
**දු.ක 0112505088/ 0714014467 වෙබ් අඩවිය : www.methsaviya.org හෝ www.methsaviya.lk**

# බෞද්ධයකුගේ පරම පවිත්‍ර වූ නිර්වාණය දක්වා යන මාර්ගය නිරූපණය කරනා ස්තූපය




## 01. පේසා වළලු තුන

චෛත්‍යයක ආරම්භයේ පේසා වළලු තුනකින් දර්ශනය වන අතර මෙම පේසා වළලු තුන මගින් සීල, සමාධි, ප්‍රඥා අර්ථ ගන්වයි. මෙය ත්‍රි ශික්‍ෂාව නම් වේ.

• **සීලය** - නිවන් මගෙහි මුල් පියවර සීලයයි. ගිහි පින්වතුන් නිති පන්සිල්, පෝය අටසිල් ආරක්‍ෂා කිරීම, ඉතා සංවරව ආමිස, ප්‍රතිපත්ති පූජාවෙන් වන්දනා කර කුසල් වඩවා ගැනීම බෞද්ධ පිළිවෙතයි.

• **සමාධිය** - නිවන් මගෙහි දෙවැනි පියවර සමාධියයි. සීලයෙන් තොර සමාධියක් නොලැබේ. සීලයෙන් සංවර වී සමාධියෙන් සිත එකඟ කර ගැනීම නිවන් මාර්ගය වේ.

• **ප්‍රඥාව** - සීලයෙහි පිහිටා විදර්ශනාව වඩවා ප්‍රඥාව දියුණු කර ගැනීම නිවන් මගෙහි තුන්වන පියවරයි. චෛත්‍ය වන්දනාවේ දී මෙම පේසා වළලු තුන මගින් දැක්වෙන සීල, සමාධි, ප්‍රඥාව ඔබත් ඇති කර ගන්න.

## 02. ධාතු ගර්භය

බුදු සමිඳුන් දේශනා කළ අසූහාරදාහක් ශ්‍රී ධර්මස්කන්ධය ශාරීරික ධාතු, ධාතු ගර්භය මගින් නිරූපණය කරයි. එය මෙනෙහි කරමින් ආමිසයෙන් ප්‍රතිපත්ති පූජාව කෙරෙහි යොමුවන්න.

## 03. බෝපත් සතර

චෛත්‍යයක සතර දිශාවෙන් දැක්වෙන බෝපත් හතරෙන් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ නිරූපණය වේ.

• **මෙත්තා** - මෛත්‍රි කිරීම, මිතුරු බව, සියලු සතුන් කෙරේ මෙත් වැඩීම.

• **කරුණා** - දුකට පත් අයට පිහිට වීම, උදව් උපකාර කිරීම, අසරණ අයට පිහිට වීම, කරුණාව දැක්වීම.

• **මුදිතා** - අන් අයගේ දියුණුව දැක අවංකව සතුටු වීම.

• **උපේක්ෂා** - මැදිහත් බව, ජීවිතය යථාවබෝධයෙන් දැකීම, අටලෝ දහම හමුවේ ඇලීම් හා ගැටීම් වලින් මිදීම.

## 04. හතරැස් කොටුව

හතරැස් කොටුව මගින් නිරූපණය වන්නේ, දුකට පත් සත්වයා සංසාර දුකින් මුදවාලීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ චතුරාර්යය සත්‍ය වේ.

**දුක්ඛ සත්‍යය - දුක**
**සමුදය සත්‍යය - දුක ඇති වීම**
**නිරෝධ සත්‍යය - දුක නැති කිරීම**
**මාර්ග සත්‍යය - දුක නැති කිරීමේ මාර්ගය**

අපිත් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගනිමින් නිවන් මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරමු.

## 05. කොත් කැරැල්ල

චෛත්‍යයෙහි කොත් කැරලි 08 කි. එයින් සංකේතවත් වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය පහත පරිදි දැක්විය හැකිය.

- සම්මා දිට්ඨි
- සම්මා සංකප්ප
- සම්මා වාචා
- සම්මා කම්මන්ත
- සම්මා ආජීව
- සම්මා වායාම
- සම්මා සතිය
- සම්මා සමාධිය

• **සම්මා දිට්ඨි** - නිවැරදි දැකීමයි, සසර දුක බව දැකීම, දුකින් මිදීමේ මාර්ගය, අවබෝධ කර ගැනීමට උත්සාහ කිරීම.

• **සම්මා සංකප්ප** - ලෝභ, ද්වේශ, මෝහය නැති කර ගැනීම, තරහ, වෛරය, ක්‍රෝධය දුරුකර ගැනීම, මෙත් සිතින් ජීවත් වීම.

• **සම්මා වාචා** - ධර්මය අවබෝධය සඳහා ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ හැසිරීමෙන් නපුරු වචන, බොරු, කේලාම්, හිස් වචන වලින් වැළකී සිටීම.

• **සම්මා කම්මන්ත** - ධාර්මික කර්මාන්ත වල යෙදීම, අනුන්ගේ හිත සුව පිණිස කටයුතු කිරීම යනාදිය.

• **සම්මා ආජීව** - අවි ආයුධ, වස විෂ, මත් ද්‍රව්‍ය, මසට සතුන් ඇති කිරීම, විකිණීම, කූට වෙළෙඳ ව්‍යාපාර ආදියෙන් වැළකීම නිවැරදි ජීවන ක්‍රමයයි.

• **සම්මා වායාම** - උපන් අකුසල් දුරු කිරීම, නූපන් අකුසල් නූපදවා ගැනීම, උපන් කුසල් දියුණු කර ගැනීම, නූපන් කුසල් උපදවා ගැනීම. මෙය සතර සම්‍යක් ප්‍රධාන වීර්ය උපදවාගැනීමයි.

• **සම්මා සතිය** - කළ අකුසල්, නොකළ කුසල් ගැන නොසිතා මේ මොහොතේ පටන් යෝනිසෝ මනසිකාරයෙන් කුසල් වඩවා ගැනීම.

• **සම්මා සමාධි** - සිත පිරිසිදුව පවත්වා ගනිමින් සමථ විදසුන් භාවනා වඩවා නීවරණ ධර්ම යටපත් කර ගැනීම.

## 06. චූඩා මාණික්‍යය

චෛත්‍යයක චූඩා මාණික්‍යයෙන් නිරූපණය වන්නේ සියලු දුක් නැති කිරීමෙන් ලබන නිවනයි.

අංක එකේ සිට අංක හය දක්වා සඳහන් ව ඇති ධර්ම කරුණු අවබෝධකර ගනිමින් මේ ගෞතම බුද්ධ ශාසනයේ දීම දුක අවබෝධ කර ගනිමින්, දුක නැති කිරීමෙන් ලබා ගන්නා වූ පරම ශාන්ත අමා මහ නිවන් සුවය ඔබ අප සියළු දෙනාගේ ම පැතුම විය යුතු වන්නේය. ඒ සඳහා ඔබ සැමට ප්‍රඥාව පහළ වේවා!.

---

**18-2962 - එම්. කේ. ප්‍රියන්ත මහතා විසින් ලිපියකින් උපුටා ගන්නා ලදී.**

# තුති කුසුම්

**පහත වැඩසටහන් සඳහා ආධාර පරිත්‍යාග ලබා දුන් සුපිංවතුන් හට මේ කරගත්තා වූ කුසලය නිවන් දක්නා ජාති දක්වා ම ඔබ පසුපස එන සෙවනැල්ල සේ පවතීවායි ප්‍රාර්ථනා කරන්නෙමු !**

## 2018 මාර්තු 11 දින සිට තේ පැන් සඳහා දායකත්වය ලබා දුන් සුපිංවතුන්



**2018/03/11** : දේවිකා විජේවීර මිය.
**2018/03/18** : ධනුෂ්කා චන්ද්‍රසිරි මිය
සුජීවා ජයන්ත මිය.
රන්මලී මානවඩු මිය.
ලසන්ත වඩුගේ මහතා.
ශිවන්ති ප්‍රනාන්දු මිය.
**2018/03/25** : හේමාලි මානවත්ත මිය.
රේඛා ගුණසේකර මිය.
හේමා ගමආරිය මිය.
**2018/04/28** : උදය ගුණරත්න මහතා.
**2018/05/13** : සරත් වර්ණකුලසූරිය මහතා.
**2018/05/20** : මිතිලා උදයංගනී මිය.
**2018/05/25** : ඒ. එස්. තුෂාර මහතා.
**2018/06/10** : ධර්මසිංහ මහතා.
සෝමපාල නාවල මහතා.
ප්‍රභා නාවල මිය.
චාන්දනී බස්නායක මිය.
පද්මිණී කුම්පිට මිය.
ශානිකා සමරකෝන් මිය.
අතුල නානායක්කාර මහතා.
**2018/06/17** : එච්. එස්. නාලනී පීරිස් මිය.
වරුණි හිරණ්‍යා මිය.
ධනුෂ්ක මහතා.
ඩබ්. කරඳවල මිය.
බන්දුසේන ජයවර්ධන මිය.
අයි. එම්. සිරිවර්ධන මයා.
**2018/06/24 : 38 නොවැම්බර් කණ්ඩායම**
ප්‍රසාද් මහතා.
සුභාෂ් මහතා.
එස්. එම්. වික්‍රමසිංහ මහතා.
නෙතිමා මිය.
එම්. එච්. සමන්තිලකා මිය.
සනත් මහතා.
සිල්වා මහතා.
පෙරේරා මිය.
යසෝධරා රන්වල මිය.
**2018/07/15** : රන්මලී නානායක්කාර මිය.
**2018/07/22** : සමපත් හිරිඇල්ල මයා.
**2018/07/29** : පියල් මහතා.
දුමින්දි මිය.
**2018/08/12** : කේ.ආර්. ධර්මසේන මයා.
රූපා ධර්මසේන මිය.

## කළුබොඩ භාවනා අසපුව සඳහා පූජාකල පරිගනක තිරය වෙනුවෙන් හා මරණයට කැප වූ හා හිරකල සතුන් නිදහස් කිරීම වෙනුවෙන් 39 වන කණ්ඩායමට කැට ලබාදීම සඳහා ආධාර මුදල් හා දායකත්වය දැක්වූවන්

| | | | |
|---|---|---|---|
| මහාචාර්ය චන්දන ජයරත්න මහතා | 2,000.00 | ගමිත්ත සිල්වා | 1,000.00 |
| කේ. එස්. ඒ. සිල්වා | 3,000.00 | එස්. එල්. පී. පූර්ණ ප්‍රදීප් ආචාර්ය තුමා වෙනුවෙන් ලබාදුන් කැටය | 1,000.00 |
| ඩබ්. යූ. ප්‍රසංසනි | 800.00 | නුවන් පෙරේරා | 500.00 |
| චාන්දනී සල්ගාදු | 1,000.00 | පී. ඒ. සචිත රන්දිම | 500.00 |

එම්. කේ. ප්‍රියන්ත මහතා - කැටවල ඇලවීමට ස්ටිකර් නොමිලේ ලබාදීමේ දායකත්වය.
සුරත් චතුරංග මයා - ප්‍රවාහන කටයුතු සඳහා සියලු වියදම් දායකත්වය.
අභිෂේක් පෙරේරා මයා - නන් අයුරින් සිය ශ්‍රම දායකත්වය ලබාදීම.


## කොළඹ මහ රෝහලේ හෘද ඒකකයට ආධාර ලබාදුන් සුපිංවතුන්ගේ නාමලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| මහාචාර්ය චන්දන ජයරත්න | 20,000.00 | කේ. පී. දූල්වල | 1000.00 | කෝසල එදිරිසිංහ | 2000.00 |
| සුමනා ප්‍රේමරත්න | 1000.00 | ධනුෂ්ක චන්ද්‍රසිරි | 5000.00 | ඉන්දික | 2000.00 |
| ස්වර්ණා, දේවිකා, අයේෂා | 11000.00 | යසිරු ලක්ෂාන් | 500.00 | පද්මකුමාර ජයසිංහ | 3000.00 |
| පී. ජී. බී. කීර්ති | 900.00 | නලනා ද සොයිසා | 1000.00 | නිර්මලා විජයපතිරණ | 500.00 |
| අශෝකා ජයතිලක | 5000.00 | හරේනද්‍රණී සේරසිංහ | 500.00 | ප්‍රසාදි ජයරත්න | 5000.00 |
| ඩබ්. ඒ. ඩී. එස් කුමාරි | 500.00 | ඒ. කේ. ජයසිංහ | 500.00 | සන්ධ්‍යා | 2000.00 |
| චාන්දනී පෙරේරා | 1000.00 | ලක්ෂිකා සහ මධුරංග | 500.00 | එස්. පී. මධුරංග | 500.00 |
| දිනුවර දහනායක | 1000.00 | චේනුක සහ මොනිකා | 500.00 | එච්. ඩී. ජයසිංහ | 4000.00 |
| රුෂාන්ති දහනායක | 200.00 | මංජුල රණසිංහ | 500.00 | ඩී. එස්. හේවාගීගන | 500.00 |
| පී. වීරවර්ධන | 1000.00 | නිලංගනී වර්ණකුලසූරිය | 1000.00 | ස්වර්ණා ගුණසේකර | 5000.00 |
| ප්‍රේමාලි ජයවර්ධන | 300.00 | එම්. කේ. ප්‍රියන්ත | 1000.00 | මෙලන් පෙරේරා | 2000.00 |
| එස්. ජයසුන්දර | 2000.00 | විශ්වනාත් අපොන්සු | 10000.00 | මෙලනී ජයසිංහ | 2000.00 |
| එම්. සේනාරත්න / ඩී. අමරසිංහ | 1500.00 | ආර්. එම්. කොඩිකාර | 500.00 | එන්. දහනායක | 500.00 |
| එස්. එම්. වික්‍රමසිංහ | 2000.00 | කේ. ජී. නදී | 500.00 | එච්. ආර්. සොයිසා | 500.00 |
| එස්. මාටින් | 1000.00 | ප්‍රේමා සේරසිංහ | 1000.00 | නූෂා | 6000.00 |
| නමරා සමරවීර | 500.00 | කේ. ඩී. හෙට්ටිආරච්චි | 5000.00 | යසින්ත | 5000.00 |
| රමනී කුරුප්පු | 1000.00 | ජී. කේ. පනාගොඩ | 5000.00 | මෙනුර ඩයස් | 500.00 |
| අයි. එම්. සිරිවර්ධන | 500.00 | චන්ද්‍රා හේමචන්ද්‍ර | 2500.00 | අමිල පෙරේරා | 1000.00 |
| අශෝකා කුමාරි | 500.00 | එච්. එස්. පෙරේරා | 8000.00 | රාමසිංහ | 500.00 |
| එම්. ඩී. එල්. චන්දිකා | 500.00 | හර්ෂ ජයවීර | 5000.00 | පිංවන්තයින් දෙපළක් | 1000.00 |
| පී. කේ. මංචනායක | 1000.00 | ප්‍රසාද් අබේසිංහ | 2000.00 | | |

## තුති කුසුම්

### 15 වන සංවත්සර උළලේ දී පරිත්‍යාග කළ පත්කඩ සඳහා ආධාර කළ සුපිංවතුන්

| | | | | | |
|---|---|---|---|---|---|
| මහේන්ද්‍ර ජයනාත් | 10,000.00 | දේවිකා/ස්වර්ණා/අයේෂා | 3,000.00 | නිශා රණසිංහ | 1,000.00 |
| රජිව් අමරසේකර | 10,000.00 | කෝසල එදිරිසිංහ | 2,500.00 | පූර්ණා | 500.00 |
| චින්තක බණ්ඩාර | 5,000.00 | මධුරංග | 2,000.00 | ශ්‍යාමා | 500.00 |
| ඉන්දික | 5,000.00 | හේමන්ති | 2,000.00 | අශෝකා ජයතිලක | 500.00 |
| අතුල නානායක්කාර | 5,000.00 | රන්මලී | 2,000.00 | තලතා චන්ද්‍රානි | 500.00 |
| මොනිකා දමයන්ති | 5,000.00 | යසන්ත | 2,000.00 | පියල් | 500.00 |
| වේනුක ජයනාත් | 5,000.00 | තිලකසිරි | 2,000.00 | විතාන | 200.00 |
| එම්. කේ. ප්‍රියන්ත | 3,000.00 | පත්මකුමාර | 1,000.00 | මාලන් | 100.00 |
| දක්ෂිණා උදයංග | 3,000.00 | පාලිකා | 1,000.00 | | |



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## අසරණ සරණ ශිෂ්‍යත්ව අරමුදල

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ශිෂ්‍යත්ව ප්‍රදානය කරන්නට කැමති පිංවතුන් විසින් පිරවීම පිණිසයි.**

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 071 401 4467, 011 250 5088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org

සාමාජික අංකය :..................................................

දානපති / පතිනියගේ නම :..................................................

ලිපිනය :..................................................

දුරකථන අංක :..................................................

මා විසින් මසකට රුපියල් 500 / 600 / 750 / 1000 / හෝ කැමති ගණනක් රු.................... බැගින් වන ශිෂ්‍යත්ව .................... ක් අවුරුදු .................... තුළ දී හෝ දරුවන් උසස් අධ්‍යාපනය නිමා කරන තෙක් ලබා දීමට කැමති බැව් දන්වන අතර එම ශිෂ්‍යත්ව පිරිමි / ගැහැණු දරුවන් .................... දෙනෙකුට ලබාදීමට කටයුතු යොදන ලෙස ඉල්ලමි. නැතහොත් මාස 3 කට / 6 කට / 12 කට වරක් එකවර එම මුදල කාර්යාලයට ලබා දෙන බවට පොරොන්දු වෙමි.

දිනය :.................................... අත්සන :....................................

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

# ශිෂ්‍යත්ව අයදුම් පත්‍රය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: කඃ 071 401 4467, 011 250 5088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org

01. සිසුවාගේ සම්පූර්ණ නම :..............................

..............................

ශිෂ්‍යයාගේ උඩුකය පිංතූරය

02. පදිංචි ලිපිනය :..............................

:..............................

03. උපන් දිනය :..............................

04. පාසල් යන්නේ නම්, ඉගෙන ගන්නා පාසල :..............................

.............................. ශ්‍රේණිය..............................

05. මවගේ නම :.............................. දු:කඃ අංකය :..............................

ජීවත්ව සිටී ද :...( ඔව් / නැත )........ ඇයගේ රැකියාව :..............................

රැකියාව කරනා ස්ථානයේ ලිපිනය :..............................

06. පියාගේ නම :.............................. දු:කඃ අංකය :..............................

ජීවත්ව සිටී ද :...( ඔව් / නැත )........ ඇයගේ රැකියාව :..............................

රැකියාව කරනා ස්ථානයේ ලිපිනය :..............................

07. පවුලේ මාසික ආදායම රුපියල් ..............................

08. ඔබ විසින් වෙනත් ශිෂ්‍යත්ව/ ශිෂ්‍යාධාර ලබා ගන්නේ නම් හා / හෝ අතීතයේ ලබා ගත්තේ නම් ඒ පිළිබඳ විස්තර

:..............................

:..............................

09. සම්පත් බැංකුවේ ගිණුම් අංකය සහ ශාඛාව :

| ගිණුම් හිමියාගේ නම | ගිණුම් අංකය | ශාඛාව |
|---|---|---|
| | | |
| | | |

(ගිණුම් හිමියාගේ බැංකු පොතේ මුල් පිටුවේ ඡායා පිටපතක් අමුණා එවන්න) **වෙනත් බැංකු සඳහා කාර්යාලයෙන් විමසන්න.**

**මා විසින් ප්‍රකාශ කළ ඉහත සඳහන් සියලු තොරතුරු මා දන්නා පමණින් සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි.**

අත්සන :..............................

**(සැලකිය යුතුයි - මෙහි ඇති සියලුම කරුණු සම්පූර්ණයෙන්ම පුරවා එවිය යුතුය. නැතහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)**

ඊළඟ පිටුව →

## විහාරස්ථානාධිපති ස්වාමීන් වහන්සේගේ නිර්දේශය

..........................................................................................................

විහාරස්ථානයේ ඉහත සඳහන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව අප පන්සලට අයත් සීමාව තුළ ජීවත් වන බවත් / ඉරුදින දහම් පාසලේ ශිෂ්‍යාවක / ශිෂ්‍යයෙකු වන බව / නොවන බවත් හා ශිෂත්වයක් සඳහා සුදුසු බවත් දන්වමි.

විහාරාධිපති නිල මුද්‍රාව :.............................. දිනය :..............................

## විදුහල්පතිතුමා / විදුහල්පතිතුමියගේ නිර්දේශය

..........................................................................................................

විද්‍යාලයේ ඉහත නම සඳහන් ශිෂ්‍යයා / ශිෂ්‍යාව අපගේ පාසලේ .............................. වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර සපයා ඇති තොරතුරු සත්‍ය බව ද දන්වමි. මා දන්නා පමණින් ඇයට / ඔහුට වෙනත් ආධාර මුදලක් නොලැබෙන බවත් ප්‍රකාශ කරමි. ඇය/ ඔහු ශිෂ්‍යත්වයක් සඳහා සුදුසු යැයි නිර්දේශ කරමි.

විදුහල්පති නිල මුද්‍රාව :.............................. පන්ති භාර ගුරුතුමිය :..............................

## තොරතුරු සත්‍ය බවට මෙත් සවිය සාමාජිකයකු විසින් නිවසට ගොස් පරීක්ෂා කර බලා කරනු බලන නිර්දේශය

මෙත් සවිය සාමාජික අංකය .............................. නම ..............................
වන මා ඉහත සඳහන් දරුවාගේ තොරතුරු සත්‍ය වන බව හා ශිෂ්‍යත්වයක් ලබා දීම සුදුසු / නුසුදුසු යයි නිර්දේශ කරමි.

අත්සන :.............................. දිනය :..............................

## මෙත් සවිය කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශිෂ්‍යත්වය ප්‍රදානය කරන්නා .............................. මයා / මිය.

දු. ක :.............................. හඳුන්වා දුන් අංකය :..............................

ශිෂ්‍යත්වය ආරම්භ වන දිනය :.............................. අවසාන වන දිනය :..............................

මාසිකව ප්‍රදානය කිරීමට නිර්දේශිත මුදල රු. :.............................. කි.

පරිපාලන නිලධාරි :..............................

**මෙත් සවිය අසරණ සරණ කමිටු සභාපතිගේ/ මෙත් සවිය ලේකම්ගේ අනුමැතිය - අනුමත කරමි / නොකරමි**

**තනතුර** :..............................

**මෙත් සවිය නිර්මාතා හා සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ අනුමැතිය - අනුමත කරමි / නොකරමි**

**සභාපති - මහාචාර්ය චන්දන ජයරත්න මහතා :**..............................

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දීම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය.
මීට අමතරව සම ලේකම්වරු වන කෝසල එදිරිසිංහ මහතා (දු.ක : 071 632 2306) හෝ මංජුල පත්මකුමාර මහතා (දු.ක : 071 529 5855 අමතා ද හදිසි තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 41 වන භාවනා වැඩසටහන

**41 වන භාවනා වැඩසටහන 2019 මාර්තු මස 17 ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2019/02/24 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.**

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 37 වන වැඩමුළුව

**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 37 වන වැඩමුළුව 2018/12/16 දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 37 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2018/12/10 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.**


### දෙමළ භාෂාව

පාසල් යන දරුවන් සඳහා **නොමිලේ**
දෙමළ භාෂාව ඉගැන්වීම කරනු ලැබේ.
විජයාරාම විහාරස්ථානයේ දී
සෑම ඉරුදිනක ම
ප.ව. 2.00 - 4.00 දක්වා පැවැත්වේ.
**දුරකථන : 0714486680**
මෙත්සවිය සාමාජිකා - ආලෝකා කුමාරි - 19-3086

### ගණකාධිකරන හා මූල්‍ය සේවා

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරීවරයෙකු වන
මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර,
සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය,
ගිණුම් පිළියෙලකිරීම්,
ආදායම් බදු හා මූල්‍ය කළමනාකරණ උපදෙස් හා
සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.
**විස්තර : 077 2355117 අමතන්න.**

### දිදුලක ක්‍රියේෂන්ස්

විසිතුරු නිර්මාණ සමගින් අලංකාරවත් ලෙස
**මුතුකුඩ නිර්මාණය**
මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා
**සාරි නිර්මාණය කරනු ලැබේ**
**සාමාජිකා - දිලිනි**
බොරලැස්ගමුව - **0773904405**

ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණය කර
පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත්
සාමාජිකාවකට (සා.අංක. 34-5228) නැගී සිටිමට අතහිත දෙන්න...
**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**
පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය
භාර දීමට විමසන්න - **0772 353 392**

### සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්

**SIGHT 'N' STYLE OPTOMETRISTS**
නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට)
**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

**FOR A COMFORTABLE STAY IN ANURADHAPURA**
#523/10, Maithreepala Senanayaka Mawatha, Dahaiyagama Handiya, Anuradhapura.
CONTACT : NIHAL FERNANDO - PHONE : 025-2220209, MOBILE : 071-4394481

### මැහුම් කලාව පුහුණු කිරීම



මැහුම් කලාවේ සුන්දරම නිර්මාණය වූ, **රිබන් මෝස්තර නිර්මාණ සහ බ්‍රසීලියන් එම්බ්‍රොයිඩර් පුහුණු කිරීම.** නිවස අලංකාරයට බිත්ති සැරසිලි, කුෂන් කවර, මේස රෙදි ආදී බොහෝ දෑ සමඟ කුඩා ළමා ඇඳුම් සිට බ්ලවුස් සහ සාරිය දක්වාත්,
නිවැරදි ලෙස වර්ණ සංකලණය කරමින් සොබා දහමේ සුන්දරත්වය එලෙසින්ම රැකෙන පරිදි
ඉතා සියුම් නිර්මාණ පුහුණු කරණු ලැබේ.
**නිමැවුම් භාර ගැනීම සඳහා ද විමසන්න. 077 542 1001**
(ළමා නිවාසවල දැරියන්ට ශක්තියක් වීමට නොමිලේ පුහුණුව දීමට කැමැත්තෙමි)

# මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

01. සම්පූර්ණ නම ..............................

02. ස්ත්‍රී / පුරුෂ භාවය .............................. 3. ජාතික හැඳුනුම්පත් අංකය ..............................

(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .............................. 5. වයස .............................. 6. ආගම ..............................

07. ස්ථිර ලිපිනය ..............................

විද්‍යුත් තැපෑල (e-mail) .............................. දු:කඃ නිවස .............................. ජංගම ..............................

08. දිස්ත්‍රික්කය .............................. 9. විවාහක / අවිවාහක බව ..............................

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .............................. / පිරිමි දරුවන්ගේ වයස් ..............................

11. රැකියා කරන්නේ නම්, ආයතනයේ නම .............................. තනතුර ..............................

(ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ..............................

12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ..............................

13. ලිපි එවිය යුතු ලිපිනය ..............................

14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ..............................
2. ..............................

15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ..............................
2. ..............................
3. ..............................

16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ..............................

17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

..............................

19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ..............................

..............................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .............................. අයදුම්කරුගේ අත්සන ..............................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ..............................

.............................. ..............................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ..............................

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය සඳුදා, අඟහරුවාදා, හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැදුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ලිපිනය :- ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයාරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06, දුරකථන : 0112 505088, 0714 014467, www.methsaviya.org / www.methsaviya.lk

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

**2018 සැප්තැම්බර් මස 09 දින වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ දී පැවැත්වූ**


## නොමිලේ වෛද්‍ය සායනය












**මෙත් සවිය තරුණ කමිටුව විසින් මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම අරමුණු කොට මෙත් සවිය සාමාජිකයන් වෙත**

## කැට බෙදාදීම











15 සංවත්සරය

# වන සංවත්සර සැමරුම් සැ
# මෛත්‍රී භාෂණ උපහාර උ

2018 ජුනි 03 වන ඉරු දින කොළඹ 05, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාව
ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ දී මහත් උත්සවශ්‍රීයෙන් පැවැත් වූ

























ළල

තේ,
වගයි ..!





රද්දොළුගම, කුස්වල ශ්‍රී පුෂ්පාරාම මහා විහාරාධිපති,
දේශීය වෛද්‍ය විශාරද ශාසන කීර්ති ශ්‍රී විද්‍යාපති
**පූජ්‍යපාද මහඇලගම ලංකානන්ද ස්වාමීන්ද්‍රයන්වහන්සේ**
අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගෙන් මෛත්‍රී භූෂණ උපහාර ලබමින්



යක්කල, අළුගම්ගොඩ, සුවාශ්‍රමයේ,
**දේශිය වෛද්‍යශූරී රුවින්ද මාරසිංහ මැතිඳුන්**
අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගෙන් මෛත්‍රී භූෂණ උපහාර ලබමින්



අතිගරු ජනාධිපති
**මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා**
මෙත්සවියේ උපහාරයට පාත්‍ර වූ අවස්ථාව



ගරු බුද්ධ ශාසන අමාත්‍ය
**ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් උපහාර ලබමින්



පොලිස්පති
**පූජිත ජයසුන්දර මහතා**
අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් උපහාර ලබමින්



අඩු ආදායම්ලාභී පවුල් වල දුවා දරුවන්හට මෙත් සවිය මගින් අධ්‍යාපන උපකරණ ලබාදෙමින්

# පසළොස් වසරක් නොකඩවා, මෙත් සවිය සාමාජිකත්වය දැරූවන් උපහාරයට පත් වූ වගයි...





**මෙත් සවිය නායකත්ව පුහුණු වැඩසටහනට සහභාගී වූ සාමාජික සාමාජිකාවන්හට සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ අවස්ථාවන්...**



**අපවත් වී වදාළ අති පූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ තෙමස් පූර්ණය සිහි කරනු වස් එක් පිංකමක් වශයෙන් කොළඹ ජාතික රෝහලේ හෘද රෝග ඒකකයට අත්‍යවශ්‍යය ද්‍රව්‍ය සහ උපකරණ පරිත්‍යාග කිරීම 2018 අගෝස්තු 08 වන දින සිදු කරන ලදී.**



**2018 තරුණ කමිටුවේ ආධාරයෙන්, කළුබොඩ භාවනා මධ්‍යස්ථානයට පරිගණක තිරයක් පූජා කිරීම සඳහා මහාචාර්ය චන්දන ජයරත්න මහතාට භාර දුන් පිංබර අවස්ථාවෙන් මොහොතක්.**




## ලෝක විෂය බුදු නෙතින් සහ විදු ඇසින් දේශනය

**2018 අගෝස්තු මස 05 වන ඉරු දින බොරැල්ල ධම්ම ගවේෂී බෞද්ධාශ්‍රමයේදී පවත්වන ලදී.**





## නායකත්වය හා පුද්ගල සංවර්ධනය පිළිබඳ දේශනය


**2018 ඔක්තෝම්බර් මස 04 වන ඉරු දින බොරැල්ල ධම්ම ගවේෂී බෞද්ධාශ්‍රමයේදී පවත්වන ලදී.**







## කාල කළමනාකරණය හා අරමුණු ජය ගැනීම පිළිබඳ දේශනය


**2018 නොවැම්බර් මස 04 වන ඉරු දින බොරැල්ල ධම්ම ගවේෂී බෞද්ධාශ්‍රමයේදී පවත්වන ලදී.**










... 2/99, ... 011 2827044 / 0712 285 680